Revised on 7 July 2019
Accepted on 15 July 2019
JCDSKAR, 1(1) 2020 January, 27-38 pp
gisajaehnichen@web.de

context' (Erlmann, 1996, p. 55). In popular definitions of World, Music negative-characteristics prevail such as non-western, non-mainstream, non-commercial, or attributes of distinction such as indigenous, local or ethnic. All of them are self-promoting slogans that do not inform about social and historical conditions or individual motivations in the process of World Music-making. The idealising classification as contemporary tradition is misleading as well considering the fact that all music has once been contemporary. Hence, the terminological mix with traditions is rather a kind of wordplay than a serious attempt to classify creative efforts in appropriating sound elements that are unfamiliar to one's own culture.

World Music is also a teaching subject at universities and music colleges. The perception of World Music in this context does unfortunately not differ much from the abovementioned stereotypes. It might be seen as music that can be started at any time without major preparation. It serves for relaxation and therapeutic enlightenment and nurtures often biased views on exotic cultures if taught without affording the time to deepen the students' knowledge of cultural processes that shape the music they exemplarily listen to. In this context, instruments, voice characters, languages, genres, become geographically or racially labelled items that may simplify a categorisation of recent music practice. Questions of cultural and historical developments, individuality and diversity of interactions remain fairly unknown. The literature on World Music that emerged in the last decades tries to help in this matter (Miller & Sahrirari, 2009, Titon, Fujie & Locke, 2009). These 'all-round' crash courses are offered due to the fact that World Music is increasingly taught in a rather basic and regarding knowledge on diversities and differentiation patterns often less qualified way lacking some knowledge of actual ethnomusicologcial findings. Miller and Sahriari (2009: xiii) may calm down the discussion saying:

"Even though music is not a "universal language" — indeed, each musical system must be studied according to its own merits and principles—it[World Music] means by which students can enter into and experience other cultures." Thus, World Music seen from the

perspective of music education provides some important tools that should not be ignored through hypersensitive principles. One of it is the derivation of a musical discussion culture that opposes cultural conditioning in a pseudo-patriotic, nationalist or another self-idealising environment (Walcott, 2009 & Vaugeois, 2009). The danger of such development becomes obvious when observing recent scholarly output from Asian regions in which colonial times and economic struggles culminate in instrumentalising the humanities for political justifications. Though the directions that the discussion takes up cannot always be foreseen — it can drift into iconic creations of selected local models in support of localism or nationalism (Sarkissian, 2000, von Klimó & Rolf, 2006). The fact that these issues are discussed is of high importance (Frith, 1997)

The following thoughts may add to the academic discourse though not in the linear way in which "World Music" is often perceived, for example in the idealising view of Nidel (2005, p.1), who says: "I believe that music is an undervalued commodity, one that can be an important force in the quest for greater understanding among cultures around the world. The future of the media will involve the dynamic mixing of cultures as people grow closer through all forms of communication. Music is the one form of communication that is devoid of prejudice, a language without borders that speaks to us all as equals most profoundly."

Though not agreeable in most details, Nidel gives an important hint: Looking at music as a commodity. World music should be first considered to be one of many purposely labelled items of popular music, thus part of popular culture in the frame of "the music business" (Peacock, 1993) or "the music industry" (ibid.). Popular culture in general, however, is related to the specific development of the society to which it refers. In this context, we have to generally ask: What do we not name with the term World Music? What do we hide with this term?

Reification of Musical Performances

Seen from the philosophical viewpoint of anthropology, popular culture, of which World Music is a part, exists independent from

its terminological construction in manifold tangible and intangible appearances. Shape and functionality of popular culture depends essentially on the degree of commodification in a respective society (DeNora, 2003; Marshall, 2011).

The special feature of music in that context is that music is something you do rather than you have. Music exists like dance and theatre as performance, as an intangible being, something bodiless in an embodied movement. It is therefore hard to be seen as a tangible item for it becomes evident only through action.

Though sound as such consisting of oscillating air molecules can be explained materially, the process of structuring still remains intangible and depends on the excitation method and the shaping of continuity that unavoidably needs a time, a place and a subjective agent in a social setting.

However, to become 'popular', music requires a tangible shape. Without being a 'thing', music cannot be operationalised (Roberts, 1992). Thus the reification of music, which can be realised through any kind of music notation for reproduction, audiovisual recordings on a carrier, or a long term contract with an orchestra or a soloist, is an essential precondition of creating popular music. The society, therefore, must be in a state, in which the reification of music is technically possible and, more importantly, economically necessary.

Uprooting

Another basic condition for popular music is the overall tendency to become independent from place and time of its reproduction. Only after the objectified music detaches from its primary activity of production, it can be distributed throughout a wide region, even globally. Through this aimed-at distribution, original contexts cannot be recreated, which makes the music products mobile and easily adaptable. To prevent the danger of a complete indifference with which people cannot identify, contexts are re-constructed and delivered as attributive supplements. These supplements come as incorporated sound references (Musib, 2011), which follow stereotyped associations,

or in shape of attached stories and labels such as Goa-Trance, French Pop, Iranian Pop, Hongkong Cantonese Pop, Austropop, Europop, Italo disco, Viet hip-hop (Nguyen Thuy Tien, 2011).

The sound references often shrink to the appearance of symbolic instrumental arrangements, musical structures and schemes or their electronically produced simulations. To come straight to the point, KerstanMackness said to LemezLovas at the WOMEX in Copenhagen 2010 that

"The whole point of World Music is that it is something from somewhere else" (Lovas, 2010, p.85).

In the reality of the popular music business, references "from somewhere else" are only important as an attribute of the product, as a help to interpret the arbitrariness through a code of individual classification similar to a brand name or a colour batch. The variety of genres represented in endless lists of popular music trends conceals the fact that these music products are functionally quite equal.

Creating Choices

However, the distribution of music as products enables us to have a choice. One can appropriate the products and finally own them as representative images of intangible culture. This option requires the mentioned functional similarity. Therefore, the structure of the products should not lead to confusion with functionally different categories of cultural appearances. On the other hand, a bogus competition between even very similar orientations goes on. Who doesn't remember the legendary question "Beatles" or "Stones"? This question re-interprets individuality that got lost in the course of production and the randomness of the products' distribution. However, the choice must be a real choice unlimited through financial or ideological restrictions. Any limitation of choice distorts connotations and adds product components that are not based on musical contents. One example might be the artificial restriction of music due to political or ideological reasons which may lead to an increasing wish to consume the forbidden products regardless of their musical qualities.

Musical Abstraction

Forcibly, popular music must base in its central musical elements on a set of production principles which are already successfully implemented and de facto 'universalised' over a wider area. This feature of popular music is a precondition for the comparability of musical products and the essential idea of musical choice. The process of structural universalisation can be observed in historically slowly grown European or North American megacities and their suburbs as well as in fast booming Asian and African urban agglomerations such as Shanghai, Hongkong, Bombay, Jakarta, Cape Town, Accra, Addis Ababa or Cairo. In these fast-emerging cultural centres, the speed of universalisation is unequally high (Jähnichen, 2011, pp. 218–243) due to modern communication tools. However, the set of production principles used may differ from area to area. For example, in the vast area of Arab culture, has to follow at least in parts the classical Arab tradition of musical structures that base on tone rows with specific intervals. Harmonic progressions and bass lines, to which some of us are used, do not work in the same way. On the other side, popular music in this area is mostly rhythmically far more demanding than any other mainstream timeline. However, what sounds to European ears exotically is in the area of primary distribution – in this case the Arab cultural area - already a universalised and abstract product made of many rather indifferent elements in terms of musical dialects that can be easily reinterpreted by many people of a huge region.

Universalisation

Considering popular music being simple and musically less challenging might be an incorrect approach to its discussion. Perceived simplicity can be seen as the result of accommodating average needs, of summarizing musical expectations and calculating the reduction of meanings. Yet, it is not simplicity. It is the art to fill a subsequent vacuum resulting from the uprooting of musical meanings with a substance that is for many people agreeable (Wicke, 2008). The agreeable filling can be achieved through experienced music forms that lost their connotation (Negus, 1992) with time and place such as electronically produced

sound carpets created from various globalised classical genres.

In Europe, the process of universalisation went on quite slowly through standardising of notation, musical instruments, especially orchestra instruments (Seares, 2010), constructed diatonic tuning, the formal professionalization of musicianship and the step-by-step introduction of recording techniques. Thus, more and more audiences from various social layers and with different cultural background could be activated to take part as consumers in the music market. In other parts of the world, this transformation process speeded up in the last few decades owing to low-cost mass media and cultural mobility. We can observe the development of a parallel culture mirroring the global music market such as Persian hip hop, Japanese animation music, or Chinese Hardrock, not to mention all forms of pop music under different local names. Looking at these examples, one might forget that a popular music market existed already for a long time in Asian cultures evolving from local entertainment music and grown in urban context such as urban music theatre in China and the Philippines (Xu 2005: 95), or the early Indian record industry distributing ghazal and other local entertainment music (Morcom, 2007, p. 182). These forms of popular music are nowadays seen as "authentic" (Shepherd, 1977, pp. 169, 173) adds to the global music market, although all of us may know that they have been already products of universalisation within the region.

Orientalism and Commodification of Secret Reserves

In the course of popular music expansion from the most industrialised places of the world, a counter-current grew with prominent pop musicians who tried to convert some of the supposedly authentic sound colours into their concept of popular music (Said, 1978 &1993). In academic discussion, this process is called 'orientalism' (Wyrwich, 2007). The essence of music styles did not change through these experiments, but with them, a global search for 'strange sound' started that could cause curiosity among the consumers and increase the number of choices in the music market. The re-discovery of pre-universalised European music was a part of that search (Negra, 2010).

At the end of the 20th century, fast emerging economies in Asia

and South America developed their popular music concepts on the one hand in support of national or ethnic cultures on the other hand as participants of the global music market.

In these areas we experience the merging of 'colourised performance styles' in the frame of conservative popular music as described above with directly exposed music practices that are coming from communities that were just recently discovered as a source of inspiration. This process changed above all the musical perceptions and value systems in the originating communities. The transformation of local music practice into the aesthetics of authorised works can be seen as a strong intervention into cultural concepts of many communities. However, the transformation will take place as a subsequent result of the global market expansion and is willingly intended by all actively involved parties (regardless of our agreement with that process).

So, we have to do with very different classes of World Music, one that hides its global model-like production principles with sounds and effects 'from somewhere else'; and another one that is just recently transformed into something very close to the global model and proudly presented as the "more authentic world". Between these two poles, a vast number of enthusiasts acts with a more or less conscious understanding of the subsequent commodification that changes existing musical diversity into a completely different complex of refined diversities within a global music market (Toynbee & Farida, 2010; Philip, 2003).

In the first case, the musical 'enrichment' compensates for the loss of space and time attributes to the homeless products of popular music. In the second case, the strange sound that comes from a specific place and is made by certain musicians is modified to a formal shape of a global product and thus, unspecifically offered as a "secret reserve' of the music market. Additional instrumentation, arrangements and other external attributes may help to transform these products into something 'from somewhere else'. In both cases, musicians act performatively in roles that cover more than they reveal (Thobani, 2007).

Hence they become part of the endless list of popular music genres, which express an increasing spectrum that is offered to arbitrary consumers all over the world.

Therefore, the musical appearance we may call World Music consists of not more or less "world" than any other popular music product. The appropriation of these products as sound carriers, event tickets or video files realises only through a subjective re-definition based on musical experiences an intangible value. The definition of this value can be quite different from initial intentions in the creative process.

A few examples collected during the last year WOMEX in Copenhagen may illustrate this point, they show how easily one can put musical products in boxes according to its sounding appearance made of some set pieces from regional traditions. That proves, too, how powerful musical communication can be used to create or to construct cultural concepts.

Outlook

One final question will always remain: Under which conditions the view of 'World Music' as part of popular culture promises the survival or even the sustainability of cultural ideas, not to forget progress in gaining knowledge?

While teaching 'World Music' in an educational way of thinking, we should consider the background of popular music instead of transmitting an image of purely attractive sound embedded into rather shallow context icons.

If we want to make students understand in a holistic way how various music productions in the world develop and what get lost and what is re-defined during a long way of history we should strive for professional instruction and practical experience rather than for cheap solutions that make any knowledge on music or sound an item for search machines.

A first step can be academic communication on what World Music means from various perspectives and how to get from these

'views through the gaze of academia and performance practice' to a creative understanding of musical worlds. Renaming university courses does not yet change their essence. Also, the use of music instead of music is not yet the final destination. Though this plural indicates the acceptance of diversity in all aspects of music cultures, it still makes them being static and historically immobile entities. The main problem seems to be rather the understanding of 'worlds' than the understanding of music. That music is diverse and manifold in its appearances is not a mystery anymore. How about accepting that we have to deal with many worlds with escalating intersections among each other? These worlds need to be understood in course of and with the means of musical communication.

Another point is the still delayed networking with other disciplines of performing arts that could immensely contribute to this communication.

Notes

[1]Since 1860, the merging of local theatre styles and the simplification and stylisation of roles and of musical expressions lead to a mass production of urban operas, especially the Beijing opera. Similar processes can be observed during the establishment of musicals and operettas with singularised scenes and numbers such as Zarzuela in the Philippines, Saigonese Cai-luong-theatre or Malayan Bangsawan.

References

Bohlman, P. V. (2002). *World Music – A Very Short Introduction.* New York: Oxford University Press.

Erlmann, V. (1996). *Nightsong: Performance, Power, and Practice in South Africa.* Chicago: University of Chicago Press.

Frith, S. (1997). *Performing Rites: On the Value of Popular Music.* Cambridge: Harvard University Press.

Frith, S. ed. (1989). *World Music, Politics and Social Change.* Papers from the International Association for the Study of Popular Music. Manchester: Manchester University Press.

Jähnichen, G. (2011). *Studies on Musical Diversity – Methodological Approaches.* Serdang: UPM Press.

Lovas, L. (2010). *Not Just Aid You Can Dance to: A Call for a New World Music.* 10) WOMEX – The World Music Expo. Guidebook. Copenhagen: WOMEX: 82-85.

Marshall, L. (2011). The Sociology of Popular Music, Interdisciplinarity and Aesthetic Autonomy. *The British Journal of Sociology 2011, 62*(1): 154-174.

Miller, T. E. & Andrew, C. S. (2009). *World Music: A Global Journey*. New York: Routledge.

Morcom, A. (2007). *Hindi Film Songs and the Cinema.* Aldershot: Ashgate.

Musib, A. F. (2011). Sound Print as an Identification Tool. *Music and Memory* – UPM Book Series on Music Research IV.Serdang: UPM Press, pp. 159-172

Negra, D. (2010). Urban Space, Luxury, Retailing and the New Irishness. *Cultural Studies, 24*(6): 836 - 853.

Negus, K. (1992). *Producing Pop: Culture and Conflict in the Popular Music Industry.* London: Edward Arnold.

Nguyen T. T. (2011)."Vietnamese Hiphop in a Dialogue with the Past."*Film-Session 14J (Audiovisual Material) of the 41st World Conference of the International Council for Traditional Music.* St. Johns: *Memorial University* of Newfoundlan.

Nidel, R. O. (2005). *World Music: The Basics*. New York: Routledge.

Peacock, A. (1993). *Paying the Piper: Culture, Music, and Money.* Edinburgh: Edinburgh University Press.

Philip, S. (2003). Birth of a Nation: Performative Constructions of National Identity in Three Malaysian Plays. *Tirai Pangung,* 6: 38-60.

Roberts, M. (1992). "World Music" and the Global Cultural Economy. *Diaspora: A Journal of Transnational Studies2* (2): 229-242.

Rutten, P. (1994). Lokale Musik und der internationale Markplatz. *PopScriptum 2, ForschungszentrumPopuläreMusik der Humboldt-Universitätzu Berlin*: http://www2.hu-berlin.de/fpm/popscrip/themen/pst02/pst02_rutten.htm, last retrieved 5 May, 2011.

Said, E. W. (1978). *Orientalism.* New York: Vintage Books.

Said, E. W. (1993). *Culture and Imperialism.* New York: Vintage Books.

Sarkissian, M. (2000). *D'Albuquerque's Children.Performing Tradition in Malaysia's Portuguese Settlement.* Chicago: Chicago University Press.

Seares, M. (2011). The Composer and the Subscriber: A Case Study from the 18th Century. *Early Music, 39* (1): 65-78.

Shepherd, J., Phil V. & Graham V. (1977). *Whose Music? A Sociology of Musical Languages.* New York: Transaction Books.

Taylor, T. D. (1997). *Global Pop: World Music, World Markets.* New York: Routledge.

Thobani, S. (2007). *Exalted Subjects: Studies in the Making of Race and Nation in Canada.* Toronto: University of Toronto Press.

Tia DeNora (2003). Music Sociology: Getting the Music into the Action. *British Journal of Music Education, 20* (2): 165–177.

Titon, J. T., Linda F., David L. et al. (2009). *Worlds of Music: An Introduction to the Music of the World's Peoples*. 5th Edition. . Belmont: Schirmer CENCAGE Learning.

Toynbee, J. & Farida, V. (2010). World Music at the World Service, 1942-2008. *Media, Culture and Society, 32*(4): 547–564.

Vaugeois, L. (2009). Music as a Practice of Social Justice. *Exploring social justice: How Music Education Might Matter.* Edited by E. Gould, J. Countryman, C. Morton & L. Stewart Rose. Toronto: Canadian Music Educators' Association/L'Associationcanadienne des musicienséducateurs: 2-22.

Von Klimó, Árpád und Malte Rolf, eds. (2006). *Rausch und Diktatur. Inszenierung, Mobilisierung und Kontrolle in totalitärenSystemen.* Frankfurt a.M.: Campus.

Walcott, R. W. (2009). Multicultural and Creole Contemporaries: Postcolonial Artists and Postcolonial Cities. *Postcolonial Challenges in Education*. Edited by R. Coloma. New York: Peter Lang: 161-177.

Wicke, P. (2008). Das Sonische in der Musik. *PopScriptum 10. Schriftenreiheherausgegebenvom Forschungszentrum Populäre Musik der Humboldt-Universitätzu Berlin:* http://www2.huberlin.de/fpm/popscrip/themen/pst10/Wicke.htm. last retrieved 5 May, 2011.

Xu, Chengbei (2005). *An Afternoon Tea of Beijing Opera Tidbits.* Shanghai: Shanghai Press and Publishing Development Company.

Study of Sri Lankan Music and Indian Connection During the Kōṭṭē Period (1412-1597)

Nishshanka Aberathne

Abstract

The main objective of this research has been to make a study of Sri Lankan music and Indian connections during the Kōṭṭē period that extended from the reign of *Parākramabāhu VI* (1412-1467) to King *Dharmapāla* (1551-1597) under whom the kingdom of *Kōṭṭē* was a protectorate of Portugal. Whether there were any activities in the field of fine arts such as music during the Kōṭṭē period, and if so, was there any Indian impact on them has been the main problem addressed in this research. If there were any Indian connections, of what nature would they have been also a problem encountered in this research. This study has been mainly based on literary sources. The Sinhala classics such as *Sälalihiṇi Sandēśaya*, *Parevi Sandēśaya, Pärakumbā Sirita, Kōkila Sandēśaya,* and *Kāvyaśēkharaya* are considered the best products of the Kōṭṭē period. These literary works provide sufficient information to enable us to form an idea about the nature of the fine arts such as music that were prevalent during this period. It has also been revealed that even Buddhist monks gained proficiency in these arts. There was a *kavikāra-maḍuva* consisting of learned mean attached to the royal court of King *Parākramabāhu VI*. Parallel to this period, the basic foundation for the creation of a new tradition of classical music (i.e., Karnatic Music) was being laid down in South India. Prince *Sapumal* who assisted King *Parākramabāhu VI* by defeating King *Ārya Cakravarti* and became the ruler of Northern Sri Lanka was a South Indian. The facts that Prince *Sapumal* who contributed to the unification of Sri Lanka erected the *Nallūr Kōvil* in Jaffna for the Hindus, brought down the queens of *Ārya Cakravarti* to the kingdom of Kōṭṭē and succeeded King *Parākramabāhu VI* as King *Bhuvanekabāhu VI* show that the influence of South Indians including Prince *Sapumal* on the affairs of the royal court had been strongly felt. This research was able to confirm that the South Indians who exercised an influence on the royal court inserted certain classical traits of their Karnatic music into the court music of the Kingdom of Kōṭṭē and after. But we should bear in mind that during the period between 1412 and 1597 A.C., the features

Submitted on 25 May 2019
Revised on 08 October 2019
Accepted on 21 October 2019
JCDSKAR, 1(1) 2020 January, 39-55pp
nishshanka.abeyrathna@gmail.com

that distinguished Karnatic music from North Indian music were only taking shape. It is, therefore, difficult to confirm that a perfect tradition of Karnatic music based on theories of classical music clearly had a strong impact on the court music of the kingdom of Kōṭṭē.

Keywords : Karnatic music, Kōṭṭē period, King Parākramabāhu VI, Nallūr Kovil, Prince Sapumal, *sandeśa* poems

සංක්ෂිප්තය

සවැනි පරාක්‍රමබාහු රජු ගේ රාජ්‍ය කාලයේ (ක්‍රි.ව.1412-1467) සිට ධර්මපාල රජු ගේ රාජ්‍ය කාලය (ක්‍රි.ව.1551-1597) දක්වා වූ කෝට්ටේ යුගයේ (ක්‍රි.ව.1412-1597) රචිත සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය, පැරකුම්බා සිරිත, කෝකිල සන්දේශය, කාව්‍යශේඛරය ආදි සාහිත්‍ය කෘතීන්හි කෝට්ටේ යුගයේ ශ්‍රී ලාංකේය සංගීතය පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. තද් යුගයේ සාහිත්‍ය කෘති මගින් ශ්‍රී ලංකාවේ පැවැති සංගීත ආදි ලලිත කලාවන්හි ස්වභාවය අවබෝධ කරගත හැකි ය. කෝට්ටේ යුගයේ (ක්‍රි.ව.1412-1597) ශ්‍රී ලාංකේය සංගීතය සහ දක්ෂිණ භාරතීය සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ ය. සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කෙරේ. කෝට්ටේ යුගයේ භික්ෂූන් වහන්සේලා ද ලලිතකලා ක්‍රියාකාරකම්හි ප්‍රවීණත්වයක් දැක්වූ බව එම යුගයේ සාහිත්‍ය මූලාශ්‍රය මගින් පැහැදිලි වේ. වියතුන් ගෙන් සමන්විත කවිකාරමඩුවක් 6 වැනි පැරකුම්බා රජු ගේ රාජසභාවේ පැවැතිණි. එම යුගයට සමගාමී ව දකුණු ඉන්දියාවේ දී ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදාය (කර්ණාටක සංගීතය) බිහි වීමට අවැසි මූලික පදනම සකස් විය. කෝට්ටේ යුගයේ 6 වැනි පරාක්‍රමබාහු රජුට සහාය වෙමින් ආර්ය චක්‍රවර්ති පරාජය කොට උතුරේ රජ වූ සපුමල් කුමාරයා දකුණු ඉන්දියාවෙන් පැමිණි අයෙකි. ශ්‍රී ලංකාව එක් සේසත් කිරීමට දායක වූ සපුමල් කුමාරයා හින්දු භක්තිකයින් උදෙසා යාපනයේ නල්ලූර් කෝවිල සෑදීම, ආර්ය චක්‍රවර්ති ගේ බිසෝවරුන් කෝට්ටේ රාජධානියට රැගෙන ඒම සහ 6 වැනි පරාක්‍රමබාහු රජු ගේ මරණින් පසු ව 6 වැනි බුවනෙකබාහු ලෙස කෝට්ටේ රජධානියෙහි රජ වීම ආදි කරුණු විමසීමෙන් කෝට්ටේ රාජධානි කාලයෙහි දී සපුමල් කුමාරයා ඇතුළු දකුණු ඉන්දීයයන් ගේ බලපෑම ප්‍රබල ලෙස ශ්‍රී ලංකාවේ රාජසභා කටයුතු සඳහා ලැබුණු බව පැහැදිලි වෙයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ රාජසභා කටයුතු සඳහා බලපෑම් කළ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජාතිකයින් ඔවුන් ගේ ද්‍රවිඩ සාහිත්‍යයේ සහ කර්ණාටක සංගීතයෙහි ඇතැම් ශාස්ත්‍රීය කරුණු ශ්‍රී ලාංකේය රාජ සභා සංගීත කණ්ඩායමට එකතු කළ බව මෙම පර්යේෂණයෙන් තහවුරු විය. ක්‍රි.ව.1412 සිට ක්‍රි.ව.1597 දක්වා වූ කාලය වන විට දක්ෂිණ භාරතීය ශාස්ත්‍රීය සංගීතය, උත්තර භාරතීය සංගීතයෙන් වෙන් කොට හඳුනාගැනීමේ මූලික ලක්ෂණ බිහි වූවා පමණි. එහෙයින්, කර්ණාටක සංගීත සම්ප්‍රදායට අදාළ ශාස්ත්‍රීය සංගීත සිද්ධාන්තයන් මත ගොඩනැගුණු පරිපූර්ණ කර්ණාටක ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදායයක් කෝට්ටේ යුගයේ දී ශ්‍රී ලංකාවට බලපෑයේ යැ යි දැක්විය නො හැකි ය.

ප්‍රමුඛ පද: කෝට්ටේ යුගය, නල්ලූර් කෝවිල, 6වැනි පැරකුම්බා රජතුමා, සන්දේශ කාව්‍ය, සපුමල් කුමාරයා

හැඳින්වීම

අනුරාධපුර, පොළොන්නරු යුගවල සිට ම ශ්‍රී ලංකාව සහ දකුණු භාරතය අතර සංස්කෘතික සබඳතා පැවැතිණි. පොළොන්නරු යුගයේ දී දකුණු භාරතීය සබඳතා ප්‍රබල වූ බවත් ශ්‍රී ලංකාවට කර්ණාටක සංගීතයේ බලපෑම ලැබුණු බව සහ මහ පැරකුම්බා රජු ගේ රූපවතී බිසව සංගීත හා නැටුම් කලාවන් ප්‍රගුණ කළ බවත් විශ්වාස කෙරේ. එහෙත් කර්ණාටක ශාස්ත්‍රීය සංගීතයේ උපත සිදු වූ කාලය සහ පොළොන්නරු යුගයට අයත් වන කාලය අතර ඇති පරතරය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වනුයේ පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාවට දකුණු භාරතීය කර්ණාටක සංගීතයේ බලපෑමක් සිදු විය නො හැකි බව ය. එහෙත් දකුණු ඉන්දියාවේ දී කර්ණාටක සංගීතය බිහි වීමෙන් පසු ව ශ්‍රී ලංකාවට කර්ණාටක සංගීතයේ බලපෑම සිදු වූ බව මෙහි ලා අවධාරණය කළ යුතු ය. කෙසේ වෙතත් මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කෙරෙණුයේ කෝට්ටේ යුගයේ (ක්‍රි.ව.1412-1597) ශ්‍රී ලාංකේය සංගීතය සහ දකුණු භාරතීය සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමට ය.

කෝට්ටේ යුගයේ (ක්‍රි.ව.1412-1597) දකුණු භාරතීය සබඳතා

කෝට්ටේ යුගයේ (ක්‍රි.ව.1412-1597) දකුණු භාරතීය සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සවැනි පරාක්‍රමබාහු රජු ගේ රාජ්‍ය කාලයේ (ක්‍රි.ව.1412-1467) සිට හත්වැනි බුවනෙකබාහු රජු ගේ මුනුබුරු ධර්මපාල රජු ගේ රාජ්‍ය කාලය (ක්‍රි.ව.1551-1597) දක්වා කෝට්ටේ යුගයට (ක්‍රි.ව.1412-1597) අයත්වන බවත්(සුරවීර, 1997, පි. 119), තද් යුගයේ දී ගායන, වාදන හා නර්තන ආදි ලලිතකලාංගයවල දියුණුවක් සිදු වූ බවත් පැහැදිලි වෙයි.

කෝට්ටේ යුගයට සමගාමී ව පැවැති දකුණු භාරතීය විජයනගර් අධිරාජ්‍ය සමයේ පටන් ශ්‍රී ලංකාවේ රාජසභා කවිකාරමඩුව කෙරෙහි කර්ණාටක සංගීතඥයින් ගේ දායකත්වය ලැබුණු බවත් විජයනගර් අධිරාජ්‍යයේ කවිකාරමඩුවේ දී අෂ්ටදිග්ගජ කවි ගායනා කළ බවත් මෙම පර්යේෂණයේ දී අනාවරණය විය. අසිරිමත් ඉන්දියාව කෘතියේ බෂාම් (1962, පි.98) සඳහන් කරන පරිදි විජයනගර් නමැති ස්වාධීන හින්දු රාජ්‍යය පිහිටුවන ලද්දේ ක්‍රි.ව.1336 දී ය. එහෙත් ඇතැම් දකුණු ඉන්දීය ඉතිහාසඥයින්ට අනුව විජයනගර් අධිරාජ්‍යයේ ආරම්භක වර්ෂය ගැන විවිධ මතවාද පවතියි. කෙසේ වෙතත් විජයනගර් අධිරාජ්‍යය පිහිටුවීම හින්දු බැතිමතුන්ට මහත් අස්වැසිල්ලක් විය. විජයනගර් අධිරාජ්‍ය සමය තෙලුගු සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වේ.

ක්‍රි.ව.16 වැනි සියවසේ ආරම්භයේ සිට විජයනගර් අධිරාජ්‍යයේ රජකම් කළ ක්‍රිෂ්ණදේවරාය රජතුමා (ක්‍රි.ව.1509-1529) ගේ කවිකාරමඩුවේ අෂ්ටදිග්ගජ කවි ගායනා කැරිණි (රූපසටහන-01). ''දිග්ගජ'' යන්නෙන්

අලි ඇතුන් අදහස් කෙරේ. අලි ඇතුන් සේ විශාල කවි ගායනයන් හෙවත් ඉතා දීර්ඝ කවි ගායනා අෂ්ටදිග්ගජ කවි ලෙස හැඳින්වේ. අලි-ඇතුන් ගේ දිසාවන් අටක් යන්න ද අෂ්ට+දිග්+ගජ යන්නෙන් අදහස් කෙරේ. විජයනගර් අධිරාජ්‍යයේ ක්‍රිෂ්ණදේවරාය රජු ගේ කවිකාරමඩුවේ සේවය කළ තේනාලිරාමක්‍රිෂ්ණ යනු අෂ්ටදිග්ගජ කාව්‍යක්කාරයෙකි. තේනාලිරාමක්‍රිෂ්ණ ගේ ඡායාරූපයක් අංක 02 රූපසටහනේ දැක්වේ.

විජයනගර් අධිරාජ්‍යයට අයත් කාලයෙන් (ක්‍රි.ව.1336-1646) ක්‍රි.ව.1336-1565 දක්වා කාලය තෙලුගු[1] සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ. ක්‍රි.ව.16 වැනි සියවසේ දී ක්‍රිෂ්ණදේවරාය රජතුමා(ක්‍රි.ව.1509-1529) විජයනගර් අධිරාජ්‍යය පාලනය කළ අතර එම කාලයේ දී රාජ සභාවේ භාවිත වූ රාජ්‍ය භාෂාව වූයේ තෙලුගු භාෂාව යි. එවක් පටන් තෙලුගු සාහිත්‍යයේ, තෙලුගු ජාතික කර්ණාටක සංගීතඥයින් ගේ සහ තෙලුගු රජවරුන් ගේ රාජ සභා සංගීතයෙහි බලපෑම ශ්‍රී ලංකාවේ රාජසභා කවිකාරමඩුවට ලැබුණු බව ඓතිහාසික තොරතුරු මගින් අනාවරණය වෙයි. කෝට්ටේ යුගයයෙන් ආරම්භ වූ දක්ෂිණ භාරතීය තෙලුගු රජවරුන් ගේ රාජසභා කවිකාරමඩුවේ බලපෑම මහනුවර යුගය තෙක් ම පැවැති බව දෙ වන රාජසිංහ රජු ගේ කවිකාරමඩුවේ (රූපසටහන-03) තොරතුරු සහ ක්‍රිෂ්ණදේවරාය රජතුමා ගේ කවිකාරමඩුවේ (රූපසටහන-01) තොරතුරු තුලනාත්මක ව අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

ක්‍රිෂ්ණදේවරාය රජතුමා (ක්‍රි.ව.1509-1529) ගේ තෙලුගු භාෂිත රාජසභා කවිකාරමඩුවේ බලපෑම, කලම්බකම් ආදි ද්‍රවිඩ සාහිත්‍ය කෘති පරිශීලනය සහ 6 වන පරාක්‍රමබාහු රජතුමා රාජ්‍ය පාලනය සඳහා තෙලුගු කුමාරවරුන් ගේ සහාය ලබාගැනීම මගින් පැහැදිලි වනුයේ කෝට්ටේ රාජධානි සමයට සමගාමී ව පැවැති විජයනගර් අධිරාජ්‍යයේ අරම්භයේ සිට ම ශ්‍රී ලංකාව සහ විජයනගර් අධිරාජ්‍යය අතර සබඳතා පැවති බව ය.

කෝට්ටේ යුගයේ (ක්‍රි.ව.1412-1597) ශ්‍රී ලාංකේය සංගීතය

කෝට්ටේ යුගයට (ක්‍රි.ව.1412-1597) අයත් ශ්‍රී ලාංකේය සංගීතය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී තද් යුගයේ ගායන වාදන හා නර්තන යන සංගීතාංගවල දියුණුවක් සිදු වූ බව සාහිත්‍ය මූලාශ්‍රය මගින් පැහැදිලි වේ. භාරතීය සංගීතය පිළිබඳ ක්‍රි.ව.13 වැනි සියවසේ රචිත සංගීතරත්නාකර නමැති කෘතියේ සඳහන් පරිදි සංගීතය යනු ගායනය, වාදනය සහ නෘත්‍ය යන අංග තුනෙහි ම එකතුවකි. ක්‍රි.ව.15-16 සියවස්වලට අදාළ මෙම අධ්‍යයනයේ දි සංගීතරත්නාකර කෘතියේ සඳහන් සංගීතය පිළිබඳ නිර්වචනය කෙරෙහි විශේෂ අවධානය යොමු කැරිණි.

[1] තෙළිඟු ලෙස ශ්‍රී ලාංකේය ජන ව්‍යවහාරයේ සහ ඇතැම් සාහිත්‍ය කෘතිවල සඳහන් භාෂා නාමයේ නිවැරදි වහර තෙලුගු වන හෙයින් මෙම ලිපියෙහි තෙලුගු යන්න ම යොදා ඇත.

කෝට්ටේ යුගයේ භික්ෂූන් වහන්සේලා ද ලලිතකලා ක්‍රියාකාරකම්හි ප්‍රවීණත්වයක් දැක්වූ බව එම යුගයේ සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වේ. කෝට්ටේ යුගයේ දී සිංහල සාහිත්‍යයට සන්දේශ කාව්‍ය රාශියක් දායාද වූ අතර හංස සන්දේශයෙහි දැක්වෙන පරිදි කෝට්ටේ යුගයේ දී කාව්‍ය-නාට්‍ය ආදී ශාස්ත්‍ර ඉගැන්වූ පිරිවෙනක් ලෙස කැරගල පද්මාවතී පිරිවෙන ප්‍රකට ය.

''අසේ සදෙස පරසිඳු පොරණ පඬිවර
විසේසයෙන් පැවසූ නොයෙක මනහර
දොසේ දුරලමින් සඳ වියරණ ලකර
ඇසේ කියනු විසිතුරු කව් නළු සතර''

(හංස සන්දේශය, 1966:182)

රඟ බිම, රඟ මඬල ආදී වශයෙන් වූ ප්‍රාසංගික වේදිකාව පිළිබඳ යෙදුම් කෝට්ටේ යුගයේ දී භාවිත වූ බව හංස සන්දේශයේ එන කවි මගින් පැහැදිලි වේ.

''රඟන රඟ එ රඟ බිම සොඳුරු විදුලිය
රඟන රඟ වැන්න ගන කුලෙහි විදුලිය''(හංස සන්දේශය,1966:112)

''එරඟ මඩල සරතස දියෙනි තෙත් කාට
තරඟ උලැඟි ගොස ගත් සයුරක් ලෙස ට''(හංස සන්දේශය,1966:113)

සැළලිහිණි සන්දේශයෙහි ද රඟමඩල යන පදය භාවිත වී ඇති අතර එහි දී දේවාල නැටුම් පිළිබඳ ව ද සඳහන් වේ.

''නිලා දිගු නුවන් රසඳුන් තනා ඇ ඳ
බලා සිටු රඟන රඟමඩල කල්බ ඳ ''(සැළලිහිණි සන්දේශය,1990:73)

පරෙවි සන්දේශයෙහි දී නළඟන රැඟුම් පිළිබඳ වර්ණනා කරන අවස්ථා ද හමු වේ.

''සුලකුළු මෙවන් නළු නළඟන කැන් සරඟ
බල රඟමඩල පරෙවිඳු සඳ පැහැ සරඟ''

(පරෙවි සන්දේශය,1967:167)

ඉහත සඳහන් සන්දේශ කාව්‍ය මගින් කියැවෙන තොරතුරු අනුව කෝට්ටේ යුගයේ දී සංගීත ක්‍රියාකාරකම් පැවැති බව ප්‍රකාශ කළ හැකි ය. එහෙත් උක්ත සාහිත්‍ය මූලාශ්‍රය කිසිවකින් දකුණු ඉන්දීය කර්ණාටක ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදායයෙහි බලපෑමක් පිළිබඳ ව හෝ එකී සංගීත සම්ප්‍රදාය පිළිබඳ කිසිදු තොරතුරක් හෝ හමු නො වේ.

කෝට්ටේ යුගයේ ශ්‍රී ලාංකේය සංගීතය කෙරෙහි දක්ෂිණ භාරතීය බලපෑම

කෝට්ටේ යුගයේ ඇතැම් සාහිත්‍ය මූලාශ්‍රයවල දක්ෂිණ භාරතීය සංගීත ආදි සංස්කෘතිකාංගවල බලපෑම පිළිබඳ තොරතුරු සඳහන් නොවුණ ද කෝකිල සන්දේශය, පැරකුම්බා සිරිත ආදි සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය මගින් තද් යුගයේ ශ්‍රී ලාංකේය සංගීතය කෙරෙහි දක්ෂිණ භාරතීය බලපෑම පැහැදිලි වේ. කෝට්ටේ යුගයේ රාජ්‍ය විචාළ 6 වැනි පරාක්‍රමබාහු රජතුමා ගේ කවිකාරමඩුව පිළිබඳ කියැවෙන අවස්ථාවක් කෝකිල සන්දේශයෙහි සඳහන් වේ.

''සොඳ එළු දෙමළ මාගද සකු බස පසි ඳු
සෙද මියු රසින් නොසැකෙවි කිවියෙහි පුරු දු
ඔද ගුණ ගිහිනි නම් කුල යුත් මහ කිවි ඳු
වැඳ වැඳ කියති නොමඳව කවි බැඳ විරි ඳු''

(කෝකිල සන්දේශය, 1962:155)

සිංහල, දෙමළ, සංස්කෘත හා මගධ භාෂා ප්‍රගුණ කළ කාව්‍යකරණයෙහි දක්ෂ කවීන් විරුද කවි ප්‍රබන්ධ කොට ගායනා කළ ආකාරය කෝකිල සන්දේශයේ එන ඉහත සඳහන් කවියෙන් නිරූපණය කෙරේ. කෝකිල සන්දේශයෙහි 155 වැනි කවිය අනුව ශ්‍රී ලාංකේය රාජසභාවන්හි කාව්‍ය ප්‍රබන්ධකරණය සඳහා සංස්කෘත හා දෙමළ භාෂාවන් භාවිත වූ උතුරු ඉන්දියාවේ සහ දකුණු ඉන්දියාවෙහි බලපෑමක් සිදු වී ඇත.

සිංහල ප්‍රශස්ති කාව්‍ය අතර වර්තමානයෙහි දක්නට ලැබෙන පැරණිතම ප්‍රශස්ති කාව්‍යය වනුයේ පැරකුම්බා සිරිත ය. කෝට්ටේ යුගයේ රචිත පැරකුම්බා සිරිත ලලිතකලාව පිළිබඳ සාධක රාශියක් සැපයෙන මූලාශ්‍රයකි. සය වන පැරකුම්බා රජු ගේ රාජසභාවේ කවිකාරමඩුවක් පැවැති බව දක්නට ලැබෙන අතර රාජසභා කවීන් ගායනා කළ කවිවල එකතුවක් ලෙස පැරකුම්බා සිරිත හැඳින්විය හැකි ය. ඇතැමුන් දක්වනුයේ පැරකුම්බා සිරිතේ එන කවි බොහෝවක් කවිකාරමඩුවක දී කියැවුණු බව ය (වික්‍රමසිංහ,1964, පි. 234). එසේ ම, තවත් අයකු ගේ(ඉහළගම, 2015, පි.36) අදහස වන්නේ එහි සියලු ම කවි ගායනය සඳහා ම රචිත බව ය.

''දකුතු මෙ නිරිඳු නුවන් ලත් පල ලැබෙයි සිතුවොත් දුක් ඇරේ
නුමුතු රසබස් ඇසුව දෙලොවැමැ සැපැත් පැමිණෙයි අරතරේ
දිමුතු යස තෙද නුවණ ගුණ කිව කැමැති යම් දෙය සඳු කෙරේ
අමුතු බැඳි පද කියමි එබැවින් අසවු වියතුනි සබතුරේ''

(පැරකුම්බා සිරිත, 2003:99)

දෙමළ බසින් විරුදු කවි සඳහා යෙදුණේ විරින්දු යනු ය. ඒ අනුව පැරකුම්බා සිරිත් කවියා ද විරුදු කවි යෙදූ සේ ය. වියතුනි සබතුරේ යන්නෙන් රජවාසලේ කවිකාර මඩුවේ වියත්තු ගැනෙති (වික්‍රමසිංහ, 2003). එහි අරුත අලුත් බැඳුම් යන්න ය. අමුතු බැඳි පද කියන්නේ කවිකාර මඩුවේ කාව්‍යක්කාරයින් ය. එයින් පැහැදිලි වනුයේ වියතුන් ගෙන් සමන්විත කවිකාරමඩුවක් 6 වැනි පැරකුම්බා රජු ගේ රාජසභාවේ පැවැති බව ය. 6 වැනි පැරකුම්බා රජු ගේ රාජ්‍ය කාලය වනුයේ ක්‍රි.ව.1412-1467 දක්වා වූ කාලය (සුරවීර, 1976) යි. එම යුගයට සමගාමී ව දකුණු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදාය (කර්ණාටක සංගීතය) දකුණු ඉන්දියාවෙහි බිහි වීමට මූලික පදනම වැටී තිබුණි. ඉහත සඳහන් සියලු කරුණු මගින් පැහැදිලි වනුයේ විද්වතුන් විසින් රචනා කොට ගායනා කරන ලද කවි පැරකුම්බා සිරිතෙහි අන්තර්ගත බවත්, වියතුන් විසින් එකී කවි කර්ණාටක ශාස්ත්‍රීය සංගීතාංග අනුසාරයෙන් ගායනා කළ බවත් ය. තව ද පැරකුම්බා සිරිත සහ කෝකිල සන්දේශය මගින් කෝට්ටේ යුගයේ ශ්‍රී ලාංකේය සංගීතය කෙරෙහි දක්ෂිණ භාරතීය බලපෑම තහවුරු කෙරෙන බවත් කිව යුතු ය.

එහෙත් ක්‍රි.ව.15 වැනි සියවසේ දී දකුණු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදාය හෙවත් කර්ණාටක සංගීතය බිහි වීමට මූලික පදනම වැටී තිබුණ ද කර්ණාටක සංගීතයෙහි ක්‍රමවත් ශාස්ත්‍රීය භාවිතයක් ව්‍යවහාරයට පැමිණියේ ක්‍රි.ව.16 වැනි සියවසේ මුල් කාලයේ සිට ය. එවන් තත්ත්වයක් මත 6 වැනි පැරකුම්බා රජු ගේ රාජ සභාවේ කවිකාරමඩුවට ක්‍රමවත් වූ කර්ණාටක සංගීතයේ ආභාසය ලැබී ඇති බව තීරණය කිරීම ඉතාම අසීරු කටයුත්තකි.

දක්ෂිණ භාරතීය ද්‍රවිඩ සාහිත්‍යයෙන් ලද ආභාසය

කෝට්ටේ යුගයේ දී ශ්‍රී ලංකාවේ සිංහල ප්‍රශස්ති සහ ඒ ආශ්‍රිත සංගීත භාවිතය ඉතා දියුණු තත්ත්වයක පැවැතිණි. සංස්කෘත, තෙලුගු, දෙමළ වැනි භාෂා සාහිත්‍යයන් ගේ ආභාසය ලැබීම එකී දියුණුවට බලපෑ ප්‍රබල හේතුවක් වන්නට ඇතැ යි විශ්වාස කෙරේ. කෝට්ටේ යුගයේ සාහිත්‍ය කෘතීන්හි විරහ, යුධ, කීර්ති, ප්‍රතාප වැනි වර්ණනා දෙස බැලීමේ දී දක්ෂිණ භාරතීය කලම්බකම් නම් සාහිත්‍යයේ ආභාසය ලැබී ඇති බව පැහැදිලි වේ. විශේෂයෙන් ම කෝට්ටේ යුගයේ රචිත පැරකුම්බා සිරිත නමැති ප්‍රශස්ති කාව්‍ය කෙරෙහි කලම්බකම් සාහිත්‍යයේ බලපෑම ලැබුණු බව පැහැදිලි වේ.

කලම්බකම් යන්නෙන් මිශ්‍රණය නැතහොත් සංයෝගය යන අර්ථය දනවයි. විවිධ ආකාරයේ කාව්‍ය ප්‍රයෝග සහ විරිත්වලින් බැඳුනු කවි අන්තර්ගත කාව්‍ය සංග්‍රහය කලම්බකම් කාව්‍ය සංග්‍රහයක් ලෙස හැඳින්විය හැකි ය. කවියක අවසන් වචනය ඊළඟ කවියේ ආරම්භයට භාවිත කිරීම

ද කලම්බකම් නමින් හැඳින්වේ (නන්දිකලම්බකම්, 1955). දක්ෂිණ භාරතීය ද්‍රවිඩ කිවිවරයන් විසින් විරචිත දේව ස්තෝත්‍ර ද කලම්භකම් ලෙස හඳුන්වයි. එය 'කරම්භක' යන සංස්කෘත නාමයේ ම පර්යාය නාමයක් ලෙස ද හැඳින්විය හැකි ය. පීටර් සිල්වා දක්වන පරිදි උත්තර භාරතයේ බිහි වූ ප්‍රශස්ති දක්ෂිණ භාරතයට පැමිණි බවත් 'විරින්දු' යන නම ඔවුන් ඒ සඳහා භාවිත කළ බවත් 'කදම්බ' යන පදය අනුව තනාගත් 'කලම්බක' යන තවත් නමක් එයට වූ බවත් කිව හැකි ය (ජිනානන්ද හිමි, 1964).

කලම්බකම්හි කාව්‍ය කෘතීවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ කාව්‍ය නායකයා ගේ ගුණ අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමයි. මේ සඳහා නොයෙක් දෙවිවරුන්, රජවරුන් ප්‍රස්තුත කරගෙන ඇත. නන්දිකලම්බකම්, මධුරෙකලම්බකම්, කාසීකලම්බකම්, කයිලෙකලම්බකම්, තිරුවරංගකලම්බකම්, කච්චික් කලම්බකම් ආදි වශයෙන් දක්ෂිණ භාරතීය කලම්බකම් කාව්‍ය කෘති බොහෝවක් දැකිය හැකි ය. කලම්බකම් කාව්‍ය මල් මාලාවක ආකාරයට අන්ද්‍රාදි ශෛලියෙන් රචනා කළ යුතු බවට ද සම්මතයක් පවතී. නන්දිවර්මන් රජු පිළිබඳ තොරතුරු ඇතුළත් නන්දිකලම්බකම් නමැති කාව්‍ය කෘතිය ක්‍රි.ව. 9 වැනි සියවසෙහි රචනා වූවක් බවත්, කලම්බකම් සාහිත්‍යයේ හමු වන ප්‍රථම සහ විශිෂ්ට කෘතිය ලෙසත් සැලකේ. කතෘ අඥාත ය. මෙම කෘතිය නන්දිවර්මන් රජු ගේ සහෝදරයෙකු විසින් රචිත බවට ද විශ්වාසයක් පවතියි. මධුරෙ කලම්බකම් නමින් හැඳින්වෙනුයේ ක්‍රි.ව. 12 වැනි සියවසේ දී ශිව දෙවියන් පිළිබඳ ව ලියන ලද කෘතියක් වන අතර එහි මධුරෙ නම් නගරය ගොඩ නගන ලද ආකාරය පිළිබඳ තොරතුරු ද අන්තර්ගත ය. එය මධුරෙ ප්‍රදේශ සාහිත්‍ය නමින් ද හැඳින්වේ. එකී කාව්‍ය කෘතිය පසු ව භාවිතයේ පහසුව උදෙසා මධුරෙ කලම්බකම් යනුවෙන් හැඳින්විණි.

කලම්බකම් නම් ද්‍රවිඩ කාව්‍ය සාහිත්‍ය සහ කෝට්ටේ යුගයේ ප්‍රශස්ති අතර ඇති සමානතා පිළිබඳ ව විමසීමේ දී අම්මානෙ නමැති කාව්‍ය ප්‍රයෝගය පිළිබඳ ව අවධානය යොමු වේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රශස්ති කාව්‍ය ලෙස සැලැකෙන පැරකුම්බා සිරිත තුණුරුවන් ගුණ නමස්කාර කරමින් ආරම්භ කර ඇති අතර පසු ව ලියැවුණු ප්‍රශස්ති කාව්‍ය හින්දු දෙවියන් ගේ ගුණ ගායනා කරමින් ආරම්භ කෙරේ. නරේන්ද්‍රසිංහ වර්ණනාවෙහි ගණදෙවි ආශිර්වාදය පතමින් කාව්‍ය ආරම්භ කර ඇත.

''පද්මාරූඪවිධිඃ ත්‍රිවික්‍රම සිවඃ ත්‍රිදසාධිපාත්‍රධ යඃ
සෙනානි ගජ වත්‍රා කර්ක සයලරුද්‍රනීවා ශී සව රං
එතෙන ජර්ජර විත්ත පුරිනදයා කුර්වන්තු ආයුඃශ්‍රීයඃ
වීරෝදාර නරේන්ද්‍රසිංහ නූපතීර ඤන්ත සංවත්සරං''

(සේදරමන්, 1970, පි.92)

නන්දිකලම්බකම්හි ප්‍රථම පද්‍යය ද ගණදෙවි ආශිර්වාදය පතන්නකි.

''මුම්මයි පුවනම් මුලුතීන්ද්‍ර - මුදල්වි යෝඩුම් විඩයිපාහන්
අම්මෙමෙ තුරුහ මුත්තම් එන - අලයිප්ප ආංගේ සිරිදහන්ඩ
තම්මින් මුත්තම් කොල නෝක්කි - චැට්ට්‍රේ නහයික්කම් වේලමුහන්
චම්මෙමෙ මුලරි මැලර්තාල් අම් - චෙන්නෙන මිසයිත් පුනෙවාමේ''

නන්දිකලම්බකම් කාව්‍ය කෘතියේ ආරම්භයේ සිට දොළොස් වැනි කවිය තෙක් ගණ දෙවියන්, ශිව දෙවියන්, පාර්වතී දේවිය, විෂ්ණු දෙවියන් ඇතුළු හින්දු ආගමික දෙවිවරු වර්ණනා කර ඇත. සිංහල ප්‍රශස්තිවල ද එම ලක්ෂණය දැකිය හැකි ය.

නන්දිකලම්බකම් සහ අනෙකුත් කලම්බකම් කාව්‍ය සාහිත්‍ය කෘතීන්හි එළිසම ලක්ෂණය අන්තර්ගත ය. දකුණු ඉන්දීය කලම්බකම් නම් ද්‍රවිඩ සාහිත්‍යයේ බලපෑම නිසා සිංහල කාව්‍ය එළිසම වී යැ යි ද විශ්වාස කෙරේ.

කාව්‍ය නායකයා වෙත පණිවිඩ යැවීමේ දූත කාර්යය කලම්බකම්හි සහ සිංහල ප්‍රශස්තිහි දැකිය හැකි ලක්ෂණයකි.

''මාට්ටාදේ ඉත්තනෙ නාල් මාල් නන්දිවාන් වැරයිතෝල්
පාට්ටාදේ මැල්ලෙයර් කෝන් පැරියානෙ පැරුච්චුවඩු
කාට්ටාදේ කැයිදැයි පොලිලුලවුම් කාවිරිනිර්
ආට්ටාදේ වැයි තෙන්නෙ ඇයිරමුම් වෛදීරේ''

(නන්දිකලම්බකම්, 1955)

(මම කොතෙක් ආයාචනය කළත් පර්වතය වන් නන්දිවර්මන් ගේ උරහිසෙහි පහස නොලදිමි. ඔහුට ප්‍රශංසා කිරීමටවත් මට අවසර නොදුන්නේ ය. ඔහු පෙරහැරේ එනවිට ඇතා ගේ පා සළකුණවත් දකින්නට මට අවසර නොදුන්නේ ය. ඔහු ගේ සුවඳ ඇති තාලෙල මල් (වැටකේ මල්) වත්ත අසළින් ගළා යන කාවේරි ගංගාවෙන් ස්නානය කර මගේ සිතෙහි දැවෙන්නාවූ ගින්දර නිවාගැනීමට හෝ අවස්ථාව නොදුන්නේ ය. යෙහෙළියනි, මගේ සිතේ ගින්දර නිවාගැනීමට අවස්ථාව නොදී නූල් බඳිමින්, කොහොඹ අත්තෙන් පවන් සළමින්, ඵල රහිත ක්‍රියාවන් කරමින් මගේ සිතේ දුක නැති කරන්න උත්සාහ ගන්නේ ඇයි? මම කීකලක සුවයක් ලබම් ද?)

පැරකුම්බා සිරිත (1970:24) එය මෙසේ ප්‍රකාශ කරයි.

''බන්දා මින්දද මද අරවින්දා සරලා සර යානේ
මන්දා නිල තුරඟට නැගෙමින්දා වියොවග නං වානේ
චන්දා නල ලෙස විය නෙත නින්දා නොලදිමි තනි යානේ
කැන්දා වරෙ පැරකුම් නරනින්දා සකි සඳ සඳ පානේ''

කවියක මුල් පෙළිය අවසන් වන අක්ෂරය හෝ වචනය ඊළඟ පේළියෙහි ආරම්භයට යොදාගැනීමේ ආන්ද්‍රාදි ශෛලිය කලම්බකම් කාව්‍ය සාහිත්‍යයේ දක්නට ලැබෙන ලක්ෂණයකි. එම ලක්ෂණය සිංහල ප්‍රශස්ති කාව්‍යයන්හි ද දැකිය හැකි ය.

''තරිඳු ගුණයෙන් ගැඹරින් කිරිඳු
කිරිඳු බලයෙන් දිරියෙන් ගිරිඳු
ගිරිඳු නුවණින් විකුමෙන් සිරිඳු
සිරිඳු දින පැරකුම් නිරිඳු'' (සේදරමන්, 1970, පි. 8)

කෝට්ටේ යුගයෙන් පසු ව මෙරට බිහි වූ ප්‍රශස්ති කාව්‍ය බොහෝ විට අර්ථ රසයෙන් හීන ශබ්ද රසයට පමණක් මුල්තැන දුන් බව මහනුවර යුගයේ ඇතැම් කාව්‍ය කෘති අධ්‍යයනයෙන් පැහැදිලි වේ. මහනුවර යුගයේ දී සිංහල ප්‍රශස්ති තුළ ද්‍රවිඩ වචන භාවිතය අධික වීම ද එයට හේතු විය හැකි ය.

කෙසේ වෙතත් ඉහත සඳහන් තොරතුරු අනුව කෝට්ටේ යුගයේ සිංහල ප්‍රශස්ති කාව්‍ය සාහිත්‍යයේ පෝෂණය උදෙසා ද්‍රවිඩ කලම්බකම් කාව්‍ය සාහිත්‍යයේ බලපෑම ලැබුණු බව පැහැදිලි වේ. ඒ අනුව ද්‍රවිඩ සාහිත්‍යානුගත සංගීතයක බලපෑම සිංහල ප්‍රශස්තියට ලැබුණු බවත්, එහෙයින් ගායනය උදෙසා රචිත ප්‍රශස්ති රාජසභාවේ දී ගායනා කොට ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමේ දී දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත ලක්ෂණ අනුගමනය කළ බවත් පිළිගැනීම සහේතුක ය.

හයවැනි පරාක්‍රමබාහු රජතුමා දකුණු ඉන්දීය සපුමල් කුමාරයා ගේ සහාය ලබාගැනීම

වසර 200කට පසුව උතුරේ ද්‍රවිඩ පාලනය පරාජය කොට ඒකීය ස්වෛරී රාජ්‍යයක් ගොඩ නැගීමේ ගෞරවය හිමි වී ඇත්තේ කෝට්ටේ රජකම් කළ හය වැනි පරාක්‍රමබාහු රජතුමාට සහ සපුමල් කුමාරයාට ය. වසර 200කට අධික කාලයක් ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් නොවූ අතර උතුරුකරයේ පාලනය විදේශීය බලපෑම්වලට යටත් ව පැවැතිණි. කෝට්ටේ රාජධානියේ භාරකාරත්වය හය වැනි පරාක්‍රමබාහු රජු භාරගන්නා විට ද එම තත්ත්වය එසේ ම විය. එනම් ඒ වන විට ද උතුරුකරයේ පාලනය ගෙන ගියේ ආර්ය චක්‍රවර්ති නම් වූ පාලකයෙකි. එම පාලකයා

පරාජය කර ඒකීය ස්වෛරී රාජ්‍යයක් ගොඩනැගීමේ ගෞරවය හිමි වී ඇත්තේ කෝට්ටේ රජකම් කළ හය වැනි පරාක්‍රමබාහු රජතුමාට සහ සපුමල් කුමාරයාට ය.

දකුණු ඉන්දීය විජයනගර් රාජ්‍යයේ රජවරුන් ගේ සහාය ශ්‍රී ලංකාවේ උතුරුකරයේ පාලනය ගෙන ගිය ආර්ය චක්‍රවර්ති රජුට හිමි විය. තව ද ආර්ය චක්‍රවර්ති ගේ හමුදාවේ කර්ණාටක භටයන් සේවය කිරීමෙන් පැහැදිලි වනුයේ ශ්‍රී ලංකාවේ රජුට මෙන් ම ප්‍රාදේශීය රජවරුන්ට ද දකුණු ඉන්දීය සෙබළුන් සේවය කොට ඇති බව යි. දකුණු ඉන්දියාවෙන් පැමිණි හමුදාවට ජාවක කෝට්ටේ හෙවත් අලිමංකඩ අයිති ව තිබී ඇති බව කෝකිල සන්දේශයේ එන කවියකින් ද නිරූපණය කෙරේ.

''ජාවක සමග පැරකුම් නිරිඳුගෙ විපුල
ඒවක පැමිණි සපුමල් කුමරිඳු පබල
තේවක ගුණැති කණ්ණඩියෙන් බිඳ තුමුල
ජාවක කෝට්ටේ දැකයන් මග අසල''

(කෝකිල සන්දේශය, 1962)

ඒ අනුව සපුමල් කුමාරයා ජාවක කෝට්ටෙන් ශ්‍රී ලංකාවට පැමිණියේ ද යන්න විමසුම් කටයුතු ය. කෝට්ටේ යුගයේ ලියැවී ඇති ඇතැම් ග්‍රන්ථවල සපුමල් කුමරු හය වැනි පරාක්‍රමබාහු රජු ගේ පුතකු ලෙස සඳහන් කර ඇත. සුරවීර දක්වා ඇති රාජ නාමාවලි සන්සන්දනය මගින් පැහැදිලි වනුයේ ද හය වැනි බුවනෙකබාහු රජු හය වැනි පරාක්‍රමබාහු රජු ගේ පුත් කුමාරයා බව යි (සුරවීර, 1976, පි. 105,120). එහෙත් නන්දන ධර්මරත්න (2015) සඳහන් කරනුයේ සපුමල් කුමරු හය වැනි පරාක්‍රමබාහු රජු ගේ මරණින් පසු හය වැනි බුවනෙකබාහු නමින් කෝට්ටේ රජු බවට පත් වූ බව ය. එසේ වුව ද හය වැනි පරාක්‍රමබාහු රජු ගෙන් පසු ව ඔහු ගේ මුනුබුරු දෙ වන ජයබාහු ලෙස රජ වූ බවත් ඉන් අනතුරු ව හය වැනි පරාක්‍රමබාහු ගේ පුත් හය වැනි බුවනෙකබාහු රජු ලෙස රජ වූ බවත් රාජාවලියේ (1976: 119) සඳහන් වේ.

එහෙත් සපුමල් කුමාරයා හය වැනි පරාක්‍රමබාහු රජු ගේ පුතකු නොවන බව පෘතුගීසි වාර්තා හා ඓතිහාසික මූලාශ්‍රය අනුව පැහැදිලි වේ. පෘතුගීසි වාර්තා සහ ඓතිහාසික මූලාශ්‍රයට අනුව සපුමල් කුමාරයා ගේ චරිතාපදානය මෙසේ ය.

''හය වැනි පරාක්‍රමබාහු රජ සමයේ දකුණු ඉන්දියාවේ ඉදිරි වෙරළින් යම්කිසි පුද්ගලයකු කෝට්ටේ රාජධානිය තෙක් පැමිණියේ ය. ඉදිරි වෙරළ යනු මලබාරය බව ඉතිහාසඥ මතය වේ. එසේ රජු හමුවට පැමිණි පුද්ගලයා ගේ නම පණික්කල් නම් වූයේ ය. ඔහු උසස් රාජ වංශයකට අයත් ක්‍රියාශීලී

අයෙකු වූයේ ය. ඔහු ගේ දක්ෂතාව නිසා ම රජතුමා ඔහුට මාළිගාවේ තනතුරක් දී රදළ කුල කතක් සරණපාවා දී ඇත.'' (ධර්මරත්න, 2015)

ඉහත සඳහන් ප්‍රකාශයට අනුව පණික්කල් යනුවෙන් හඳුන්වා ඇත්තේ සපුමල් කුමාරයා විය හැකි ය. 6 වැනි පරාක්‍රමබාහු රජු හා සපුමල් කුමරු විසින් උතුරුකරයේ රජකම් කළ ආර්යචක්‍රවර්ති පරාජය කරනු ලැබූ අතර සපුමල් කුමරු උතුරුකරය අත්පත් කරගෙන ආර්ය චක්‍රවර්තීන් ගේ සේනාවත් රැගෙන කෝට්ටේ රාජධානියේ රජු වෙත ගමන් කර ඇති ආකාරය සැළලිහිණි සන්දේශයේ (සේනානායක, 1990) සඳහන් වනුයේ පහත පරිදි ය.

''නිල තුරඟට නැගෙමින් රිවි දෙවි කිරණ
දුලකර සෙසත් මිණි බරණ කිරණින
බළ පිරිසෙන් හිමි යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන''

ආර්යචක්‍රවර්ති ගේ මරණින් හෝ පලායාමෙන් අනතුරු ව උතුරුකරයේ නව පාලකයා ලෙස සපුමල් කුමරු පත් කළේ 6 වැනිපැරකුම්බා රජ ය. පසුමල් කුමරු උතුරේ පාලනය ගෙන ගිය කාලයේ දී යාපනයේ නල්ලූර් කෝවිල සාදා හින්දු ජනයාට වන්දනාමාන කිරීමට අවස්ථාව ලබාදුන්නේ ය. වර්තමානයේ දී ද නල්ලූර් කෝවිලෙහි ස්තෝත්‍ර ගයන විට සපුමල් කුමරු සිහිපත් කෙරේ.

6 වැනි බුවනෙකබාහු රජු (ක්‍රි.ව.1470-1478) ලෙස රාජ්‍යත්වය හෙබ වූ සපුමල් කුමාරයා සහ ඉන් පසු ව කෝට්ටේ රාජධානියෙහි රජකම් කළ සියලු ම රජවරු පන්දර් නමින් හැඳින්වූ බව කුතෝ ගේ ලියවිලි අනුව පැහැදිලි වේ. ඒ අනුව බුවනෙකබාඹ පන්දර්, කඉපුර පන්දර්, ජවිර ප්‍රකුරමබගො පන්දර්, ධුම ප්‍රකුර මබගො, බොළුනෙගබො පන්දර්, දුමබෙල්ල හෙවත් දොන් ජුවං පෙරිය පන්දර් ආදි වශයෙන් කෝට්ටේ යුගයේ රජවරු හැඳින්වේ, එහෙත් 6 වැනි පරාක්‍රමබාහු සහ ඔහු ගේ මුණුබුරු (ජයබාහු) සඳහා පන්දර් යන නාමය යෙදූ බව කුතෝ ගේ ලියවිලිවල ද සඳහන් නො වේ. එහි දී එම දෙදෙනා හැඳින්වෙනුයේ මහප්‍රකුර මබගො සහ ජවිරා යනුවෙනි (සුරවීර, 1976). එයින් පැහැදිලි වනුයේ 6 වැනි බුවනෙකබාහු රාජ්‍ය කාලය හා ඉන් පසු කාලයේ දී ශ්‍රී ලංකාවට දකුණු ඉන්දීය බලපෑම ප්‍රබල ලෙස ලැබුණු බව ය. පන්දර් යන්න දකුණු ඉන්දීය ද්‍රවිඩ භාෂා නාමයකි. විජයනගර් අධිරාජ්‍ය සමයේ ද භාවිත වූ බව දකුණු ඉන්දීය ඉතිහාසඥයන් ගේ මතය යි. ඒ අනුව කෝට්ටේ යුගයේ දී ශ්‍රී ලංකාවේ ද පන්දර් නමැති ද්‍රවිඩ භාෂා නාමය භාවිත වූ බව දක්වීම සහේතුක ය.

නිගමනය

6 වැනි පරාක්‍රමබාහු රජතුමා ගේ කාලයේ දී (ක්‍රි.ව.1412-1467) ශ්‍රී ලංකාවේ උතුරේ රජකම් කළ ආර්යචක්‍රවර්තිට දකුණු ඉන්දීය රජවරුන් ගේ සහාය හිමි වීමත්, දකුණු ඉන්දියාවෙන් පැමිණි සපුමල් කුමාරයා 6 වැනි පරාක්‍රමබාහු රජුට සහාය වෙමින් ආර්ය චක්‍රවර්ති පරාජය කොට උතුරේ රජ වීම සහ හින්දු භක්තිකයින් උදෙසා යාපනයේ නල්ලූර් කෝවිල සෑදීමත්, ආර්යචක්‍රවර්ති ගේ බිසෝවරුන් කෝට්ටේ රාජධානියට රැගෙන ඒම සහ 6 වැනි පරාක්‍රමබාහු රජු ගේ මරණින් පසු ව 6 වැනි බුවනෙකබාහු ලෙස කෝට්ටේ රජධානියෙහි රජ වීම ආදි කරුණු විමසීමෙන් පැහැදිලි වනුයේ කෝට්ටේ රාජධානි කාලයෙහි දී සපුමල් කුමාරයා ඇතුළු දකුණු ඉන්දීය තෙලුගු, කණ්ණඩ, මලයාලම් සහ දෙමළ ආදි ද්‍රවිඩ ජාතිකයින් ගේ බලපෑම ප්‍රබල ලෙස ශ්‍රී ලංකාවේ රාජසභාවේ කටයුතු සඳහා බලපෑ බව ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ රාජසභාවේ කටයුතු සඳහා බලපෑම් කළ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජාතිකයින් විසින් ඔවුන් ගේ කර්ණාටක සංගීතයෙහි ඇතැම් ශාස්ත්‍රීය කරුණු ශ්‍රී ලාංකේය රාජ සභා සංගීත කණ්ඩායමට එකතු කළ බව තහවුරු වෙයි.

කෙසේ වෙතත් දකුණු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතය අනෙකුත් සංගීත සම්ප්‍රදායයන් ගෙන් වෙන්කොට හඳුනාගැනීමේ පැහැදිලි සාධක ලැබෙන ක්‍රි.ව.16 වැනි සියවසේ සිට ම ශ්‍රී ලාංකේය රාජ සභා සංගීතයට දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතඥයින් ගේ දායකත්වය ලැබුණු බව පැහැදිලි වේ. චෝළ, වඩුග, ආඬි ආදී නම්වලින් හැඳින්වුණු එවක තෙලුගු ජාතිකයින් ශ්‍රී ලංකාවේ රාජ සභාවට සෘජු ලෙස ම බලපෑම් කිරීමට තරම් ප්‍රබල විය. එවන් පුද්ගලයින් අතින් ඔවුන් ගේ දේශයෙහි සංගීතය වන කර්ණාටක සංගීතයේ රස භාව ශ්‍රී ලාංකේය රාජ සභා සංගීත කණ්ඩායමට මුහු කළ බව විශ්වාස කළ හැකි ය. එසේ නොමැති වුවහොත් ඔවුන් ගේ පෞද්ගලික රසවින්දනය උදෙසා හෝ දකුණු ඉන්දීය කර්ණාටක සංගීතය ඇසුරු කරන්නට ඇත. එහෙයින් කෝට්ටේ යුගයේ සංගීතය ආදි ලලිත කලාංග කෙරෙහි දක්ෂිණ භාරතයේ බලපෑම ඉතා ප්‍රබල ලෙස ම ලැබුණු බව නිගමනය කළ හැකි ය. කෝට්ටේ යුගයේ ශ්‍රී ලාංකේය සංගීත ඉතිහාසය පිළිබඳ තවදුරටත් විමර්ශණ සිදු කිරීම කාලීන අවශ්‍යතාවක් බව ද කිව යුතු ය.

රූපසටහන 1

ක්‍රිෂ්ණදේවරාය රජු ගේ කවිකාරමඩුව (විජයනගර් අධිරාජ්‍යය)



සටහන. විජයනගර් අධිරාජ්‍යයට අයත් ක්‍රි.ව. 1336-1565 කාලය තෙලුගු සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලැකේ.

රූපසටහන 2

තේනාලි රාමක්‍රිෂ්ණ



සටහන. ක්‍රිෂ්ණදේවරාය රජු ගේ කවිකාරමඩුවේ කාව්‍යක්කාරයෙකි. දකුණු ඉන්දීය තෙලුගු විශ්වවිද්‍යාලයේ ආචාර්ය චේනු ගෝපාලාචාරි ලබාදුන් ජායාරූපයකි.

රූපසටහන 3

දෙ වන රාජසිංහ රජතුමා ගේ කවිකාරමඩුව



සටහන. දෙ වන රාජසිංහ රජු ගේ කවිකාරමඩුවේ කවි ගායනා කරන අවස්ථාවකි. මහ ඇමති තුමා 'රජසිහ සිරිත' නම් වූ ප්‍රශස්තිය රජතුමාට පිළිගන්වන අතර උෆවේ කුඩා මොහොට්ටාල, බින්තැන්නේ ස්වාමිහු ද ජායාරූපයේ සිටිති. ඇම්. සාර්ලිස් ගේ චිත්‍රයකි. චාර්ලිස් කරුණාතිලක ක්‍රි.ව. 1916 දී එළිදැක්වූ ග්‍රන්ථයකින් උධෘත ඉහත චිත්‍රය ක්‍රි.ව. 1966 සාහිත්‍ය දින විශේෂ කලාපයෙහි අන්තර්ගත ය.

ආශ්‍රිත ග්‍රන්ථ

අබේරත්න, එන්. (2009). තෙලුගු භාෂාව සහ කර්ණාටක සංගීතය. *මියැසි සුබස 02.* කොළඹ: සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

අභයගුණරත්න, ඩී. ජී.(සංස්.). (1944). *පැරකුම්බා සිරිත.* ලංකාභිනව විශ්‍රැත.

ඉලංගසිංහ, එම්. (2005). *මධ්‍යකාලීන ලංකාවේ ආගම.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඉහළගම, එස්. (2015). *කවිකාරමඩුව.* කොළඹ: සුරස පොත්.

කරුණාතිලක, ඇම්. ඩී. ඩී. (සංස්.). (1953). *ශෘංගාරාලංකාරය.* කෑගල්ල: විද්‍යාකල්ප.

කරුණාතිලක, සී. (සංස්.). (1916). *රජසිහ සිරිත-1.* කෑගල්ල: විද්‍යාකල්ප මුද්‍රණාලය.

කරුණාතිලක, සී. (සංස්.). (1918). *රජසිහ සිරිත-11.* කෑගල්ල: විද්‍යාකල්ප මුද්‍රණාලය.

කුමාරස්වාමි, ඒ. කේ. (1962). *මධ්‍යකාලීන සිංහල කලා.* (එච්. එම්. සෝමරත්න, පරි.). කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳදෙපාර්තමේන්තුව.

කුමාරස්වාමි, ඒ. කේ. (1993), *ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ කලා හා ශිල්ප* (එච්. එම්. සෝමරත්න, සිංහල පරි.). කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

කුලතිලක, සී. ද එස්. (2007). *ලංකාවේ සංගීත සම්භවය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණවර්ධන, වී. ඩී. ඇෆ්. (සංස්.). (2009). *කෝකිල සන්දේශ.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

තිලකසිරි, එස්. (සංස්.). (2011). *පැරකුම්බාසිරිත.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ද සිල්වා. (සංස්.) .(1938). *මහාබෝධි නාරායණ චරිතය.* කොළඹ

ප්‍රේරා, පී. එස්. (සංස්.). (2009) *සැවුල් සන්දේශය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රෝහණධීර, එම්. (සංස්.). (1966). *පැරකුම්බා සිරිත* (සාහිත්‍යය-1966 සාහිත්‍ය දින විශේෂ කලාපය). කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, කේ. ඩී. පී. (1964). *කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමසිංහ, කේ. ඩී. පී. (සංස්.). (1970). *පැරකුම්බාසිරිත.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමසිංහ, කේ. ඩී. පී. (සංස්.). (1966) *හංස සන්දේශය.* කොළඹ: එම්. ඩී ගුණසේන සහ සමාගම.

සැබිහෙළ, ඒ. අයි. (සංස්.). (1967). *පරෙවි සන්දේශය: පරෙවි සඳෙස් පහදනය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

සුරවීර, ඒ. වී. (සංස්.). (1997). *රාජාවලිය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සේදරමන් ජේ. ඊ. (1970). *ප්‍රශස්ති කාව්‍ය රසය,* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

සේනානායක, ජී. එස්. බී. (සංස්.). (1990). *සැළලිහිණි සන්දේශය.* කොළඹ: ප්‍රදීප.

හේමචන්ද්‍ර, ආර්. (සංස්.). (1964). *ලංකා ඉතිහාසය.* විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ අංශය.

Abeyrathna, N. (2013). *Practical Of South Indian Music*. Colombo: R. M. Publications.

Abeyrathna, N. (2015). Indeeya Sangeethaye Swara Bhavithaye Telugu Mudrava[Paper presentation]. In *8th Reserch Conference*, (p. 19). Royal Asiatic Society of Sri Lanka

Appasamy, J. (1980). *Tanjavur Painting of the Maratha Period*. New Delhi: Abhinav Publication.

Basham, A. L .(1962). *The Wonder that was India*. London: Sigwick and Jackson.

Batuvantudave, R. (Ed.). (1957). *The Mahavansa* (First Thirty six Chapters). Colombo: Ratnakara book depot.

Bhagyalakshmi, S. (1990). *Lakshanagranthas in Music*. India: CBH publications.

Coomaraswamy, A. K. (1979). *Mediaeval Sinhalese Art*. Colombo: State Printing Corporation.

Mendis, G. C .(1932). *The Early History of Ceylon*. Delhi: Asian Educational Services.

Mukund, S. (1989). *Sangeetha Laalithya Lahiri*. Bangalore: Padmapriya Mukund.

Nagar, R. S. (Ed.). (1981). *Natyasastra*. New Delhi: Parimal

Obeysekara, D. (1999). *Outlines of Ceylon History*. Delhi: Asian Educational Services.

Paranavithana, S. (Ed.). (1959). *History of Ceylon* (Vol. I, Part I). Colombo: Ceylon University Press.

Paranavithana, S. (Ed.). (1970). *Inscription of Ceylon* (Vol. I). Colombo: Department of Archaelogy.

Purushottaman, E. N. (1975). *Tyagopanishat*. Hyderabad: Telugu University.

Rao, Chalapati (1990). *Sankara*. Hyderabad: Telugu University.

Rohanadeera, M. (1998). *History of Upcountry*. Battaramulla

Wickramasingha, D. M.(Ed.). (1912). *Epigraphi Zeylanica* (Vols. 1-4). London: Oxford University Press.

Journal of C. de S. Kulathilake Archival and Research

A Comparative Study of the Alphabet of Sri Lankan Sign Language and Abhinayadarpana

Palika Samanthi Garusinghe

Abstract

The objective of this study is to critically evaluate the interrelationship between the Sri Lankan alphabet of sign language and the hand sign language used in the book of *Abhinayadarpana*, and to highlight the benefits of this study to hearing-impaired people. This study is based on the information collected from written and non-written resources, meeting with hearing-impaired people and observing their communication using sign language. The preliminary survey confirmed that there is a similarity of the hand-signs observed in this study to the hand-signs used in *Abhinayadarpana*, and the alphabet of sign language. In the alphabet of hand sign language, the meaning of the sign is highlighted; however, the hand signs depicted in *Abhinayadarpana*, highlights both the meaning and the feeling. This is due to the usage of "vinayoga" of hand signs in *Abhinayadarpana* and the use of one hand to depict the meaning of various expressions. In "vinayoga", the meaning of one word, not of a letter, is shown using one hand sign. According to this study, the hand-signs in *Abhinayadarpana* of *Nandhikeshwara* has a close relationship with the lives of hearing-impaired children, and they seemed to use these signs in non-verbal communication in their day-to-day activities. Therefore, this study confirmed that, letting hearing-impaired children to learn the hand-signs and "vinayaga" of *Abhinayadarpana*, will make them successful in their education, and will let them to be integrated into the society as the persons with good sense.

Keywords : *Abhinayadarpana*, hand signs, hearing-impaired, *vinayōga*

සංක්ෂිප්තය

ශ්‍රී ලාංකේය සංඥා භාෂා හෝඩියේ සඳහන් අක්ෂර මාලාවේ හා අභිනයදර්පණ කෘතියේ භාවිත හස්ත මුද්‍රා පිළිබඳ තුලනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් එහි ඇති සහ-සම්බන්ධතා පෙන්වාදී එමගින් ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන්ට ලැබෙන ප්‍රයෝජන මතුකරලීම මෙම අධ්‍යයනයේ අරමුණ ය. එහි දී ලිඛිත හා අලිඛිත මූලාශ්‍රය පරිශීලනය කරමින්, ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් හමු වී සන්නිවේදනය සඳහා භාවිත විවිධ මුද්‍රා නිරීක්ෂණය

Submitted on 10 May 2019
Revised on 9 September 2019
Accepted on 15 September 2019
JCDSKAR, 1(1) 2020 January, 56-68 pp
palikasg@yahoo.com

කළෙමු. පූර්වෝක්ත ගවේෂණය මගින් ලබාගත් තොරතුරු හා උක්ත කෘති දෙකෙහි සඳහන් හස්ත මුද්‍රා අතර සම්බන්ධතා පවතින බව තහවුරු වේ. අභිනයදර්පනයේ හස්ත මුද්‍රා, සංඥා භාෂා හෝඩියේ දී බහුල ව භාවිත කෙරෙන බව එහි අන්තර්ගත රූප මගින් දැක්වෙයි. සංඥා භාෂා හෝඩියේ හස්ත මුද්‍රා අර්ථය ජනනය වීමක් සිදු කෙරෙන නමුත් අභිනයදර්පණයේ හස්ත මුද්‍රා මගින් අර්ථය හා රසය යන කරුණු දෙක ම සංවර්ධනය කෙරේ. මෙයට හේතුව වනුයේ අභිනයදර්පණයේ හස්ත මුද්‍රාවන් ගේ විනයෝග භාවිතය යි. එනම් එක් හස්තයක් භාවිත කරමින් විවිධ ක්‍රියාවන් අර්ථ ගැන්වීම යි. එහි දී එක අක්ෂරයකට නොව වචනයකින් ප්‍රකාශිත අර්ථය එක් හස්ත මුද්‍රාවකින් නිරූපණය වෙයි. නන්දිකේෂ්වරයන් ගේ අභිනයදර්පණයේ හස්ත මුද්‍රා ශ්‍රව්‍යාබාධිත දරුවන්ට සමීප සම්බන්ධතාවක් ඇති බවත්, ඒවා ඔවුන් එදිනෙදා ජීවිතයේ දී ශාරීරික ක්‍රියාකාරකම් සමඟ අවාචික සන්නිවේදනය සඳහා භාවිත කෙරෙන බවත් මෙම අධ්‍යයනයේ දී නිරීක්ෂණය විය. එබැවින් අභිනයදර්පණයේ හස්ත මුද්‍රාවන් ගේ ක්‍රියාකාරකම් හෙවත් විනයෝග ද ඒ හා සමාන ව ම සිදු කෙරෙන හෙයින් ශ්‍රව්‍යාබාධිත දරුවන්ට අභිනය දර්පණයේ හස්ත මුද්‍රා හා එහි විනයෝග අධ්‍යයනය කගිරීමට සැලැස්වීමෙන් ඔවුන් ගේ අධ්‍යාපනය වඩාත් සාර්ථක වී, රසඥතාවෙන් හෙබි පුද්ගලයන් ලෙසින් සමාජගත වීමට ඉමහත් පිටිවහලක් වන බව මෙම අධ්‍යයනයෙන් පසක් වෙයි.

ප්‍රමුඛ පද : අර්ථ හා රස ජනනය, අභිනයදර්පණ, ශ්‍රව්‍යාබාධිත, හස්ත මුද්‍රා

හැඳින්වීම

අතීතයේ සිට ම මිනිසා සිය එදිනෙදා කටයුතුවල දී හස්ත මුද්‍රා භාවිතයෙන් එකිනෙකා අතර අදහස් ප්‍රකාශ කිරීම සිදු වී ඇති බැව් ඉතිහාසය පිරික්සීමේ දී පසක් වෙයි. භාෂා භාවිතයක් නොමැති අවධියේ ප්‍රාථමික ජනයා ද හස්ත මුද්‍රා භාවිත කර ඇති අතර සතුන් දඩයම් කිරීමේ දී තම සතුට ප්‍රකාශ කිරීමටත්, තම වර්ගයා අතර අදහස් ප්‍රකාශනයේ දී ද සංඥා භාවිත කර ඇති බැව් සිතිය හැකි ය (Benerji, 1985,p.31). ඒ සඳහා ඉතිහාසගත ලිඛිත මූලාශ්‍රයක් ලෙස උම්මග්ග ජාතකය නිදසුන් සපයයි. මහෝෂධ පඬිතුමා අමරාවතී දේවියගෙන් විවාහක, අවිවාහක බව ප්‍රශ්න කරනුයේ සන්නිවේදන උපක්‍රමයක් ලෙස තම හස්තය මිට මොළවා ගැනීමෙන් හා දිග හැරීමෙන් ය. අමරා දේවිය හා මහෝෂධ පඬිතුමා හස්ත මුද්‍රා භාවිතයෙන් සන්නිවේදනය කළ අයුරු උම්මග්ග ජාතකයේ පහත සඳහන් අයුරින් දැක්වෙයි.

> ''ඉක්බිත්තෙන් මහ බෝසතාණන් වහන්සේ, ඉදින් මෝ නුවණැති වී නම් හස්ත මුද්‍රාවෙන් විචාළා දැන ගන්නීය'යි සිතා දුර ම සිට ඇඟිලි හකුළුවා මිට කළ සේක. ඒ අමරාදේවීත් විචාරන්නේය'යි දැන අත් විදාලූ හ.''

බුදුරජාණන් වහන්සේ බෝධිසත්ව කාලයේ පෙරුම් පුරමින් සිටි

සමයේ එක් ආත්ම භවයක මහෞෂධ පඬිතුමා වශයෙන් ඉපිද සිටි කල අමරා දේවිය සමඟ හස්ත මඟින් සිදු කළ සංනිවේදනය පූර්වෝක්ත සඳහනින් දැක්වෙයි (වනරත්න, 2001,පි. 41). අනුරාධපුර යුගයේ වළගම්බා රජ සමයේ මාතලේ අලුවිහාරයේ දී ථෙරවාදී හතර වන ධර්ම සංගායනාවේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඩ විය (බුද්ධදත්ත හිමි, 1959, 33,පි.174-181). එහි දී පාලි භාෂාවෙන් ජාතක කතා ලිය වී ඇති අතර එය කුරුණෑගල යුගයේ හතර වන පරාක්‍රමබාහු රජ සමයේ දී සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ දී විස්තරාත්මක ව රචනා විය. මේ අනුව විමසා බලන කල මෙම කෘති රචනා වූ යුගයේ සමකාලීන ජන සමාජයේ හස්ත මුද්‍රා භාවිතය පිළිබඳ ප්‍රථම වරට ලිඛිත සාක්ෂියක් ලෙස පෙන්වාදිය හැකි ය.

වත්මන් ලෝකයේ විවිධ රටවල විවිධාකාර ව ඊට ආවේණික ව එදිනෙදා ජන සමාජයේ දී ද හස්ත මුද්‍රා භාවිත කෙරේ. එනම් තුන් වන සියවසේ ලියැවුණු නාට්‍යශාස්ත්‍රය හැරුණුකොට අභිනයදර්පණය, අභිනයචන්ද්‍රිකා, විෂ්ණු ධර්මෝත්තර පුරාණය, සංගීතරත්නාකරය, නෘත්‍ය රත්න කෝෂා, මනසොල්ලාස, හස්තමුක්තාවලී, හස්ත ලක්ෂණ දීපිකා, සංගීතෝපානිශද් සරෝදය යන විවිධ කෘති මඟින් අප මාතෘකාවට බඳුන් වූ හස්ත මුද්‍රා පිළිබඳ ව යම් යම් වෙනස්කම්වලින් යුක්ත කරුණු සඳහන් වේ. ඒ අතුරින් භරතනාට්‍යම්හි ආංගික අභිනය සඳහා ප්‍රධාන වශයෙන් නන්දිකේශ්වරයන් ගේ අභිනයදර්පණය කෘතිය භාවිත කෙරේ. එහි දී අසංයුත හා සංයුත හස්ත පිළිබඳ ව මෙන් ම ඥාති සබඳතා, දේවතා, නවග්‍රහ, දසාවතාර හස්ත වර්ගීකරණය දැක්වේ (පතිරණ, 2003, පි.45-86). එහි සඳහන් හස්ත මුද්‍රා ශ්‍රී ලාංකේය ජන සමාජයේ එදිනෙදා සුලභ ව භාවිත කෙරේ. රථවාහන පොලිස් කොස්තාපල්වරයෙකු රථවාහන ධාවනය හැසිරවීම සඳහා කුඩා නලාවක් (විසිලයක්) හා හස්තය මඟින් පදිකයින්ට හා රියදුරන්ට සංඥා දක්වමින් අණ කිරීමක් සිදු කෙරෙනු දක්නට ලැබේ. එමඟින් රස ජනනය කිරීමක් නොවුන ද අර්ථාත්මක අණ කිරීමක් හැඟවෙයි. මෙහි දී අභිනයදර්පණයේ පතාක හස්තය (පතිරණ, 2003, පි. 80) නිරන්තරයෙන් භාවිත කෙරෙනු දක්නට ලැබෙනුයේ රථවාහනවලට ''යනු හා නවතිනු'' යනුවෙන් හස්තය පෙන්වීමෙනි.

තවත් විටෙක සමාජය ඉදිරියේ පෙම්වතියන් අතර භාවිත රහස් සංඥා සඳහා ද අභිනයදර්පණයේ හස්ත මුද්‍රා භාවිත කෙරෙන බව පෙන්වාදිය හැකි ය. එහි දී පෙම්වතා පෙම්වතියගෙන් හාදුවක් ඉල්ලා සිටිනුයේ දබර ඇඟිල්ල තම දෙතොල්වල රඳවාගනිමිනි. මෙහි දී අභිනයදර්පණයේ සඳහන් **සූචි** (පතිරණ, 2003, පි. 81) යනුවෙන් හැඳින්වෙන හස්ත මුද්‍රා භාවිත කෙරේ. එපමණක් ද නො ව, ඔවුන් දුරකථන ඇමතුමක් ගන්නා අයුරු ද අවාචික සංනිවේදනයෙන් පෙන්වන අවස්ථා ද පවතියි. මෘග ශීර්ෂ යනුවෙන් අභිනයදර්පණයේ හැඳින්වෙන මෙම හස්ත මුද්‍රාව නිර්මාණය

වනුයේ මාපට ඇඟිල්ල හා සුළැඟිල්ල දිගු කොට තබා අනෙක් ඇඟිලි තුන එකතුවන සේ අත්ල දෙසට නැමීමෙනි. මෙම හස්ත මුද්‍රාව **මෘගශීර්ෂ** (පතිරණ, 2003, පි. 81) නමින් අභිනයදර්පණයේ හැඳින්වෙන මුද්‍රාව හා සාම්‍යයක් දක්නට ලැබේ.

නිතර සමාජයේ භාවිත හස්ත මුද්‍රා තිහක් නූතන ජංගම දුරකථනවල ස්ථාපිත කොට ඇත. මේවා ද කෙටි පණිවිඩ යැවීම සඳහා යොදාගැනේ. එහි දී අභිනයදර්පණයේ සඳහන් ශිඛර, හම්සාස්‍ය, මෘග ශීර්ෂ, අංජලී, පතාක මුෂ්ටි, සුචි, කර්තරීමුඛ යනාදී හස්ත මුද්‍රා (පතිරණ, 2003, පි. 80-83) නිදසුන් ලෙස දැක්විය හැකි ය.

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද, කුඩා දරුවන් ද සිය ශරීර කෘත්‍ය ඉටු කරගැනීමට යාමට ගුරුවරයා ගෙන් හෝ වැඩිහිටියන් ගෙන් අවසර ඉල්ලනුයේ හස්තයේ සුළැඟිල්ල පමණක් දිගු කර අනෙක් ඇඟිලි මිට මොළවාගනිමිනි. එහි දී ද බාන හස්තය මගින් අවාචික සංනිවේදනයක් සිදු කෙරේ. එසේ ම කුඩා දරුවන්ට කෝපය සිත්හි ඇති වූ විට මාපට ඇඟිල්ල පමණක් දිගු කොට තැබෙන සේ ඉතිරි ඇඟිලි මිට මොළවාගෙන එම මාපට ඇඟිල්ල පොළොව දෙසට හරවා තැබීමෙන් කෝපය මතු කර දක්වයි. මෙහි දී අභිනයදර්පණයේ ශිඛර මුද්‍රාව (පතිරණ, 2003, පි. 81) පහතට හරවා දක්වමින් අර්ථය ප්‍රකාශ කරයි.

එමෙන් ම තවත් කෙනෙකු සමඟ තරහ බව හැඟවීමටත් අභිනයදර්පණයේ **සුචි හස්ත** මුද්‍රාව බොහෝ කුඩා දරුවෝ භාවිත කරති. මෙහි දී දෑතෙහි දබර ඇඟිලි පමණක් දිගු කොට අනෙක් ඇඟිලි මිට මොළවාතබාගෙන දික් කළ දබර ඇඟිලි එකිනෙකට කැපී යන සේ දෙපසට ඇදීමෙන් මිතුරා හෝ මිතුරිය සමඟ අමනාප යැ යි සංනිවේදනය කෙරේ. අභිනයදර්පණය මෙම මුද්‍රාව සංයුත හෙවත් දැත උපයෝගිතාවෙන් සිදු කෙරන හස්ත මුද්‍රාවක් වන **පාශ** (පතිරණ, 2003, පි. 84) යනුවෙන් හැඳින්වෙයි.

ඒ හැරුණුවිට පෞද්ගලික බස්රථ ධාවනය කරන්නන් අතර ද විවිධ හස්ත මුද්‍රා භාවිතයක් පවතියි. මෙහි දී තවත් බසයක් ඉදිරියෙන් ළඟ ළඟ ම ගමන් ගන්නා බව පැවසීමට හස්ත මුද්‍රා භාවිතයෙන් අනෙක් රියදුරාට සංනිවේදනය කෙරේ. මිනිසා ගේ ශාරීරික සුවතාව සඳහා වර්තමානයේ දී බහුල ව සිදු කෙරෙන යෝගා ව්‍යායාම සඳහා ද හස්ත මුද්‍රා භාවිත කෙරේ (Naragatti, 2019, p. 1).

ගණිත ගුරුවරු සිය ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා භාවිත කරන ඉගැන්වීම් ක්‍රමවේද අතර ශරීර භාෂාව මගින් සිදු කරන අදහස් ප්‍රකාශනය හා මුද්‍රා භාවිතය අන්තර්ගතය (Andra, 2009, p. 1). එහි දී සංඛ්‍යා ප්‍රදර්ශනය කිරීමේ දී හස්තයේ ඇඟිලි භාවිතයෙන් සංනිවේදනය

සිදු කෙරේ.

ලක්දිව ජනයා අතර ආවේනික වෙනත් හස්ත මුද්‍රා ද ශ්‍රී ලාංකේය ජනයා අතර භාවිත කෙරෙන බව ශ්‍රී ලංකා සංඥා භාෂා හෝඩි පිරික්සීමේ දී දක්නට ලැබේ (කුරුකුලසූරිය, 2011, පි. 1-13).

අප ගේ අධ්‍යයන ක්ෂේත්‍රයට නතු වූ අභිනයදර්පණයේ පෙන්වාදෙන හස්ත මුද්‍රා හා ශ්‍රී ලාංකේය සිංහල සහ දෙමළ භාෂා සංඥා හෝඩිවල භාවිත හස්ත මුද්‍රා තුලනාත්මක අධ්‍යයනයක් කොට එමඟින් ශ්‍රව්‍යාබාධිත දරුවන්ට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව විග්‍රහ කිරීම මෙහි අරමුණ යි.

එමෙන් ම සිංහල හා දෙමළ සංඥා භාෂා හෝඩිවල අක්ෂර සඳහා භාවිත හස්ත මුද්‍රා සහ අභිනයදර්පණයේ හස්ත මුද්‍රා කොතෙක් සහසම්බන්ධතා දක්වන්නේ ද යි විග්‍රහ කිරීම මෙහි තවත් අරමුණක් වෙයි. මේ පිළිබඳ විමසාබැලීමට පෙර හස්ත මුද්‍රා යන්න නිර්වචනය කිරීම වැදගත් වෙයි. හස්ත මුද්‍රා නිර්වචනය පිළිබඳ ව විමසීමේ දී එය සංස්කෘත භාෂාව හා සම්බන්ධතා ඇති බැව් පසක් වේ. එනම් හස්ත මුද්‍රා යනුවෙන් අර්ථ දෙකක් පිළිබඳ ව ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි (සෝරත හිමි, 1963, පි. 549-595) දැක්වේ. වලංගුභාවය දක්වන ඇඟිලි සළකුණු ලෙස ද, අත්වලින් හැඟවෙන සංඥාව හෙවත් සන්නිවේදනය ලෙස ද එම කෘතිය කරුණු දක්වයි.

මුද්‍රා යන්න පර්සියානු වචනයක් වන මුහාර් යන වචනයෙන් බිහි වූ බවත්, මුද්‍රා යන්නෙන් ශරීරයේ තිබෙන අංගයන් ගේ චලන එක් සංස්කෘත වචනයකින් දක්වන බවත්, එය මුද්‍රා යන්නෙන් හඳුන්වන බවත් ප්‍රොජේෂ් බැනර්ජි වැඩි දුරටත් කරුණු දක්වයි. එමෙන් ම මුද්‍රාව යන්න සංඥාව ලෙස ද හඳුන්වයි(Benerji, 1985, p. 32).

එහෙත් මුහාර් යනු අරාබි වචනයක් බවත්, එයින් ලේඛකයා, ලියන පුද්ගලයා, අකුර, අක්ෂරය, නීතිය සම්බන්ධයෙන් කටයුතු කරන දැනුවත් කරන්නා යනුවෙන් හඳුන්වන බවත් ඇතැම් ශබ්දකෝෂකරුවෝ පෙන්වාදෙති (මුස්තාෆා, 2001, පි. 643).

මුද්‍රාව යන වචනයෙහි නිවැරදි මූලාරම්භයක් දී ඇත්තේ සංස්කෘත පෙළපොත්වලිනි. එහි දී චින්හා (Chinhā) යන්න අතේ ඇඟිලි නිවැරදි ව ස්ථානගත කිරීමක් වන අතර ඒවා ආගමික පුද පූජාවල දී වන්දනාමානය සඳහා යොදාගෙන ඇති බවත් පැහැදිලි වේ (Benerji, 1985, p.30).

අදහස් ප්‍රකාශනයට වචන භාවිත නොවන කල්හි අංග චලනය ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් නර්තනයට සම්බන්ධ කොට ගැනිණි. අංග චලනය ප්‍රකාශන චලනයක් වශයෙන් යොදාගැනීමේ දී හස්ත මුද්‍රා බෙහෙවින් ඉවහල් වූ බව භාරතීය නර්තන ශෛලීන් අධ්‍යයනයෙන්

පැහැදිලි වෙයි.

භාරතීය නර්තනයේ විකාශනය පිළිබඳ සෙවීමේ දී ආගමික ස්වරූපය පදනම් කරගැනිණි. ආගමික දේවාලවල බැතිමතුන් හට ආගමික කතා පුවත් විස්තර කරදීමේ දී මෙම හස්ත මුද්‍රා භාවිත වූ බව පෙනේ. මුහුණෙන් ප්‍රකාශ වන අදහස සමඟ හස්තය මඟින් සිදු කෙරෙන මුද්‍රාව ද මෙහි දී විශේෂ වෙයි. එබැවින් මෙම සංඥා හස්ත මුද්‍රා යනුවෙන් නිර්වචනය වූ බව පෙන්වාදිය හැකි ය.

ශ්‍රවණ හැකියාව ඉතා දුර්වල එමෙන් ම සම්පූර්ණයෙන් ම බිහිරි සිසුන් හට කුඩා අවධියේ සිට ම තම දෙමව්පියන් හා හිත මිතුරන් සමඟ සංනිවේදනය කිරීම සඳහා අධ්‍යාපනඥයන් විසින් දෘශ්‍ය ඉගෙනුම් ක්‍රමවේද හඳුන්වාදෙමින් විවිධ කෘති සම්පාදනය කර ඇත. එහි දී සිංහල, ඉංග්‍රීසි, දෙමළ හෝඩි අක්ෂර, වර්ණ, සත්ත්වයන්, දෙවිවරු, පළතුරු, ඇඳුම් පැලඳුම්, සංඛ්‍යා ක්‍රම, විශේෂ පද, රටවල් යනාදි පරිහරණය කෙරෙන සියලු ම භාණ්ඩ හා එදිනෙදා කාලවකවානු යනාදිය මෙම හස්ත මුද්‍රා හෙවත් හස්ත සංකේත මඟින් ගෙනහැර දැක්වෙයි. ශ්‍රවණ ශක්තිය නොමැති සිසුවා සමාජයේ කොන් කිරීම වළක්වා මෙම සංඥා භාවිතයෙන් ඔවුනට අධ්‍යාපනය ලබා දී උසස් තත්ත්වයකට ගෙන ඒම සහ සමාජයේ අනෙක් අය හා සමාන ව රටට දැයට වැඩදායි පිරිසක් බිහි කිරීමට මෙම හස්ත මුද්‍රා හෙවත් සංඥා මහත් පිටිවහලක් වන බැව් මෙහි දී පෙන්වාදිය හැකි ය.

භරතනාට්‍යම් සඳහා භරතමුනි ගේ නාට්‍යශාස්ත්‍රය (මාරසිංහ, 2004, පි. 26-46) හා නන්දිකේශ්වර ගේ අභිනයදර්පණය මඟින් හඳුන්වාදෙන හස්ත මුද්‍රා මෙන් ම, ලොව වෙසෙන ශ්‍රවණ හැකියාව දුර්වල දරුවන්ට කුඩා අවධියෙහි සිට ම සංනිවේදනය කිරීම සඳහා හස්ත මුද්‍රා මඟින් දෘශ්‍ය ඉගෙනුම් ක්‍රමවේදයක් අධ්‍යාපනඥයින් විසින් 1966 ආරම්භ කරන ලදි (හෙට්ටිආරච්චි, 2009, පි. 3). එදිනෙදා ජීවිතය හා සම්බන්ධ සිද්ධීන් හා සංකල්ප සියල්ලක් ම ප්‍රකාශ කිරීමට සමත් සංඥා කෝෂය හෙවත් සංඥා භාෂාවක් ශ්‍රවණාබාධිත පිරිස අතර භාෂාවක් ලෙස භාවිත කෙරිණි. මෙම භාෂා රටින් රටට වෙනස්වන බැවින් ඒ ඒ රටේ භාවිත භාෂාව කතා කරන ආකාරය අනුව සංඥා භාෂාව භාවිත කෙරෙයි.

ශ්‍රී ලංකා සංඥා භාෂා කෘතිවල සඳහන් සිංහල හා දෙමළ හෝඩිවල අක්ෂර දෙස විමසිල්ලෙන් බැලීමේ දී බහුල ව දක්නට ලැබෙනුයේ හස්ත මුද්‍රා ය. එහි දී සිංහල හෝඩි අක්ෂරයන්හි ස්වර (හෙට්ටිආරච්චි, 2009:5) හා ව්‍යංජන (හෙට්ටිආරච්චි,2009,පි.6) සැකසෙනුයේ එක් හස්තයකිනි. එක් අතකින් දක්වන මුද්‍රා අසංයුත හස්ත මුද්‍රා යනුවෙන් අභිනයදර්පණ කෘතියේ සඳහන් වේ (පතිරණ, 2003, පි. 45).

අභිනයදර්පණයේ සංයුත හස්ත මුද්‍රා යනුවෙන් හැඳින්වෙන මුද්‍රා නිර්මාණය කෙරෙනුයේ දෑත උපයෝගි කරගෙන ය (පතිරණ, 2003, පි.45). දෙමළ හෝඩියේ දී දෑත උපයෝගී කොටගෙන ස්වර හා ව්‍යඤ්ජන දැක්වීමෙන් අක්ෂර නිර්මාණය කෙරේ. එබැවින් හස්ත දෙකෙහි ම සම්බන්ධතාවෙන් සිදු කෙරෙන හස්ත මුද්‍රා අභිනයදර්පණයේ සංයුත හස්ත මුද්‍රා නමින් හැඳින්වුව ද ඒවා ද්‍රවිඩ සංඥා හෝඩියේ හස්ත සංඥා සමඟ සම්බන්ධතාවලින් යුක්ත බව කිව නො හැකි ය. සංඥා භාෂා හෝඩියේ වමෙන් පතාක හස්තයත් දකුණු හස්තයෙන් සූචි මුද්‍රාවත් වෙනත් විවිධ මුද්‍රා භාවිතයෙන් දෙමළ අක්ෂර සංනිවේදනය කිරීමේ සංඥා ඊට නිදර්ශන සපයයි (හෙට්ටිආරච්චි, 2009, පි. 90-92).

විවිධ රටවල භාවිත සංඥා වර්ග එකිනෙකට වෙනස් වේ. එමෙන් ම ශ්‍රී ලංකාවේ භාවිත සිංහල හා ද්‍රවිඩ භාෂාවන්ට අනුව ශ්‍රී ලාංකේය සංඥා භාෂාවක් භාවිතයේ පවතී. මෙහි දී ලිවීම භාෂාවේ ලේඛනය අනුව සිදු වුව ද ප්‍රකාශ කිරීමේ දී සංඥා භාෂාව භාවිත කෙරේ. එබැවින් බොහෝ විට සංඥා භාෂාව භාවිත කරනුයේ සංනිවේදන කාර්යය සඳහා පමණකි. මෙම සංඥා භාෂාව හේතුකොට ගෙන ශ්‍රවණ ශක්තිය නොමැති පිරිස් හට ශ්‍රී ලංකාවට ම ආවේනික වූ එම අනන්‍යතා ලක්ෂණවලින් යුක්ත ව බිහි වූ සංඥා භාෂා ක්‍රමය හේතුකොට ගෙන ශ්‍රවණ ශක්තිය නොමැති පිරිස් සමාජයෙන් කොන් කිරීම වළක්වා අධ්‍යාපනය ලබා දී සමාජයට වැඩදායී පුද්ගලයන් බවට පත්වීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙයි. ශ්‍රී ලාංකේය සිංහල හෝඩි අක්ෂර සඳහන් සංඥා භාෂා කෘති උපයෝගී කරගනිමින් සිංහල ශ්‍රව්‍යාබාධිත ජනතාව හට ලිවීමට හා සන්නිවේදනය කිරීමට වත්මනෙහි අවකාශය ලැබී ඇත. එම සිංහල අක්ෂර හෝඩිය හා සංනිවේදනය කිරීම උගන්වනුයේ හස්ත මුද්‍රා භාවිතයෙනි. මෙම සිංහල හෝඩි අක්ෂර දෙස විමසිල්ලෙන් බැලූ කල බහුල ව දක්නට ලැබෙනුයේ එක් හස්තයක් පමණක් උපයෝගි කරගෙන දක්වන අක්ෂර ය (කුරුකුලසූරිය, 2011, පි. 12). එහි දී ස්වර සහ ව්‍යඤ්ජන අක්ෂර දෙක ම වෙන වෙන ම එක් හස්තයක් පමණක් යොදාගනිමින් පෙන්නුම් කෙරේ. මෙහි විශේෂත්වය වනුයේ අක්ෂරයක් දැක්වීමට ස්වර සහ ව්‍යඤ්ජනයෙහි එකතුව මුද්‍රා මඟින් පෙන්විය යුතු වීම ය. එහි දී නිදසුන් ලෙස 'ක' අක්ෂරය සෑදීමේ දී දකුණතින් භාවිත පතාක හස්තයත්, දකුණතින් ව්‍යඤ්ජනයට අදාළ අභිනයදර්පණයට අයත් කර්තරීමුඛ හස්තයත් යන දෙකේ එකතුවෙන් 'ක' අක්ෂරය නිර්මාණය කෙරේ (හෙට්ටිආරච්චි, 2009, පි. 7). මේ අයුරින් මූලික අක්ෂර හැරුණුකොට අනෙකුත් සෑම අක්ෂරයක් ම දැක්වීමේ දී හස්තය මුද්‍රා දෙකක් උපයෝගී කරගන්නා බව දක්නට ලැබේ. ඒ බැව් පහත සඳහන් රූප සටහනෙන් ප්‍රත්‍යක්ෂ වේ (හෙට්ටිආරච්චි, 2009, පි. 7).

රූපය 01

එක් හස්තයක් පමණක් යොදාගනිමින් 'ක' අක්ෂරය පෙන්නුම් කෙරෙන සංයුත හස්ත මුද්‍රා



ක් + අ = ක

මේ අනුව අභිනයදර්පණයේ දැක්වෙන අසංයුත හස්ත හෙවත් එක් අතක් භාවිත කරමින් සිදු කරන මුද්‍රා බහුල ව දක්නට ලැබෙනුයේ සංඥා භාෂා සිංහල හෝඩියේ සඳහන් වන මූලික අක්ෂර ම බව කිව යුතු ය. නමුත් ෂ, ෂෘ, ඔෘ, අං, අඃ, ඤ්, ඕ යනාදී අක්ෂර පමණක් එක ම හස්තය දෙආකාරයකට හසුරවමින් සංඥා භාෂා අක්ෂර හෝඩියේ දක්වා ඇත (කුරුකුලසූරිය, 2011, පි. 12). එපමණක් ද නො ව එම අක්ෂර මාලාවේ ඬ, ඥ අක්ෂරයන්ට මෙතෙක් මුද්‍රා ඉදිරිපත් කොට නොමැත (කුරුකුලසූරිය, 2011,පි. 12). ඒ සඳහා ඉහත අක්ෂර දෙකට හස්ත මුද්‍රා දෙකක් නිර්මාණය කර දැක්වීම විචාරශීලි අධ්‍යයනය මඟින් පහත අයුරින් ඉදිරිපත් කළ හැක.

වගුව 01

ඬ, ඥ අක්ෂර සඳහා නිර්මාණය කළ හස්ත මුද්‍රා

ව්‍යඤ්ජන	ඬ	හම්සාස්‍ය	ඬ් ශබ්දය බින්දුවෙන් සංකේතවත් වන ආකාරයට අනෙක් ඇඟිලිත්‍රය ඉහළට එසවන සේ තැබීම.
	ඥ	බාන හස්තයෙහි සුලැඟිල්ල හැකිලවීම	නාසික්‍ය ශබ්දයක් ගෙන දෙන බැවින් ඤ් සඳහා භාවිත හස්තය ම ඥ සඳහා ද භාවිත කර සුලැඟිල්ල චලනය කිරීම සුදුසු බව උපකල්පනය කළෙමු.

රූපය 02

ඬ, ඥ අක්ෂර සඳහා නිර්මාණය කළ හස්ත මුද්‍රා



ඥ ඬ

පූර්වෝක්ත සංඥා නිර්මාණ සිදු කිරීම හේතු වශයෙන් පහත සඳහන් කරුණු පෙන්වාදිය හැකි ය. සිංහල සංඥා හෝඩි අක්ෂරවල විශේෂත්වය වනුයේ එක ම හස්ත මුද්‍රාව විවිධ අක්ෂර කියා පෑමට භාවිත කිරීම යි. එහි දී නියමිත මුද්‍රාව රඳවාගනිමින් විවිධාකාර ව චලනය කිරීම හෝ හැසිරවීම මඟින් විවිධ අක්ෂර නිර්මාණය කෙරේ. නිදසුන් ලෙස 'ද්' ව්‍යංජනය සඳහා භාවිත අභිනයදර්පණයෙහි සඳහන් සුචි මුද්‍රාව ම '**ඩි**' යන ව්‍යඤ්ජනය පෙන්වීමේ දී මැණික් කටුව චලනය කිරීම හේතු කොටගෙන එක ම මුද්‍රාවෙන් අක්ෂර දෙකක් විදහා පාන බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම 'ඒ' ස්වරය නන්දිකේෂ්වර ගේ හස්ත මුද්‍රා අනුව සංකේතවත් වන්නේ සුචි මුද්‍රාවල දබරැඟිල්ල පමණක් ඉහළට චලනය කරන අයුරු ද 'ඓ' යන ස්වරය මැණික් කටුව චලනය කිරීමෙන් ද වෙනස් ව දක්වයි. මේ අයුරින් 'ං' අක්ෂරය සඳහා යොදාගන්නා හස්ත මුද්‍රාව ම එසේ ම තිබිය දී දබර ඇඟිල්ල හා මාපට ඇඟිල්ල එසේ ම තිබිය දී ඉතිරි ඇඟිලිත්‍රය ඉහළට විහිදුවමින් 'ඕ' අක්ෂරය නිර්මාණය කිරීම වඩාත් සුදුසු බව පෙන්වාදිය හැකි ය. එය පූර්වෝක්ත 'ං' අක්ෂරය හා සමාන ව චලනය කිරීමට ශ්‍රව්‍යාබාධිත දරුවන්ට වඩාත් පහසුවනු ඇත. ඒ අයුරින් ම 'ඤ්' අක්ෂරය පෙන්වන බාන හස්තය ම සුළැඟිල්ල පහළට හා ඉහළට චලනය කරමින් 'ඥ' අක්ෂරය දැක්වීමට භාවිත කිරීම වඩාත් සුදුසු බව මෙහි දී පෙන්වා දිය හැක. එම සංඥාව ශ්‍රව්‍යාබාධිත දරුවන්ට පහසු වනුයේ නාසික්‍ය ශබ්දයක් සඳහා භාවිත හුරු මුද්‍රාව ම ඉහළට හා පහළට පමණක් චලනය කිරීමට සිදු වන බැවිනි.

මේ හැරුණු විට ද්‍රවිඩ ශ්‍රවණාබාධිත පිරිස් හට හෝඩි අත් පොතෙහි දෙමළ අක්ෂර ඉගැන්වීමේ දී දැත ම උපයෝගී කරගෙන අක්ෂර නිර්මාණය වී ඇති බව පෙනේ. එහි දැක්වෙන පරිදි වම් හස්තයේ ඇඟිලි පහ විහිදුවා තැබෙන අතර දකුණු අතින් සුචි, තාම්‍රචූඩ, මුෂ්ටි, ඌර්ණනාභ, ත්‍රිශූලය, බාන, කපිත්ත, පතාක, මෘග ශීර්ෂ, චන්ද්‍ර කලා, කර්තරීමුඛ, මුකුල, හම්ස පක්ෂක, ත්‍රිලිංග, මුෂ්ටි, මෘගශීර්ෂ යනාදී අභිනයදර්පණයෙහි අසංයුත හස්ත භාවිත කරමින් සංඥා භාෂාවේ දෙමළ අක්ෂර බහුල ව පෙන්නුම් කෙරේ.

මේ අනුව බැලීමේ දී සංඥා භාෂාව, දෙමළ අක්ෂර හෝඩියේ හස්ත මුද්‍රා පෙන්වීමේ දී ස්වර බහුල ව අඩංගු වන්නේ වම් හස්තයෙහි ය. දකුණු අතෙහි සුචි මුද්‍රාවෙන් ස්වර පිහිටන ස්ථානය පෙන්වාදෙයි. නිදසුන් වශයෙන් මහපට ඇඟිල්ලේ තුඩ දකුණතෙහි අභිනයදර්පණයේ සඳහන් සුචි මුද්‍රාවෙන් ස්පර්ශ කිරීමෙන් **ආනා** (ප) නොහොත් දෙමළ හෝඩියෙහි **අ** යන්න දිස් වේ (හෙට්ටිආරච්චි, 2009, පි. 90). පතාක හස්තයේ ඇඟිලි විහිදුවමින් සුචි මුද්‍රාවෙන් යුත් දබරඟිල්ල උපයෝගි කොටගෙන මාපට

ඇඟිල්ල පහළට නැමීමෙන්, එනම් මාපටැඟිල්ල අල්ලෙහි මධ්‍යයට සම්බන්ධ වන සේ ස්ථානගත කර සම්බන්ධ කිරීමෙන් **ආවන්නා** (ඒ) දිස්වෙයි. මේ අයුරින් මාපටැඟිල්ල සිට සුළැඟිල්ල දක්වා අනුපිළිවෙලින් ඇඟිලිවල අග සහ මුලට දබරැඟිල්ලට ස්ථානගත කිරීම හා නැමීමෙන් පිහිටීම වෙනස් කරමින් දෙමළ හෝඩියේ ස්වර සංකේතවත් කෙරේ. ඒ බැව් පහත සඳහන් අයුරින් ප්‍රත්‍යක්ෂ වේ.

රූපය 03

දෙමළ හෝඩියේ ස්වර සංකේත



පතාක හස්තයේ ඇඟිලි පහ විහිදුවමින් දිස්වෙන හස්තය ලංකාවට ආවේනික වූ හස්ත මුද්‍රාවක් සේ සැලකිය හැකි ය. එවැනි මුද්‍රාවක් කිසිදු තැනෙක අභිනයදර්පණයේ සඳහන් නො වේ. නමුත් පහතරට ශාන්තිකර්මයක් වන 'රටයකුම' ශාන්තිකර්මයෙහි එන නානුමුරයේ දී මෙම හස්තය භාවිත කරමින් වරලසෙහි අවුල් කඩන ස්වභාවය ඉදිරිපත් වේ. එමෙන් ම එම හස්ත මුද්‍රාව ම බෙන්තර සම්ප්‍රදායයේ දහඅට සන්නිය නැමැති ශාන්තිකර්මයේ ද ලිච්ඡවි උපත් කවි ගෙන හැර දැක්වීමේ දී යාග ඇදුරා විසින් 'සූරිය රැස් විද කිලුටක් සෑදී' යන කවි පදයෙහි අර්ථය භාව අභිනය මගින් දක්වනු ලැබීමේ දී ද භාවිත කරනුයේ ඇඟිලි විහිද වූ එකී හස්ත මුද්‍රාව ම ය. සිංහල පහතරට නර්තනයේ අන්තර්ගත ශාන්තිකර්ම ක්ෂේත්‍රයේ මෙවැනි හස්ත මුද්‍රා හැරුණුකොට අභිනයදර්පනයේ සඳහන් හස්ත මුද්‍රා ද භාවිත කෙරේ (කෝට්ටගොඩ, 2001, පි. 2-5).

උක්ත කරුණු විමසාබැලීමේ දී සංඥා භාෂාවෙහි සිංහල, දෙමළ අක්ෂර, ගණිතය, නාම පද, ක්‍රියා පද, විශේෂණ පද, වරනැගීම් විභක්ති යනාදී ව්‍යාකරණ සංනිවේදනය කිරීමේ දී සිරුරේ කොටස් ද භාවිත කෙරේ (හෙට්ටිආරච්චි, 2009). හිස, ඇඟිලි, අත්, ඇස් සහ මුඛය යනාදී අංග මුහුණේ ඉරියව් මඟින් ද හස්ත මුද්‍රාව හා එහි චලනය හා ස්ථානගත කිරීම අනුව ද සංනිවේදනය කෙරේ. මෙම ලක්ෂණය ම භාරතීය නර්තනයේ දී මෙන් ම ශ්‍රී ලංකාවේ පහතරට නර්තනයේ දී සුලභ ව දක්නට ලැබේ.

හස්ත මුද්‍රා මඟින් භාව ප්‍රකාශනය කිරීමේ දී ඉහත සඳහන් සියලු ම අංග උපයෝගී කරගැනේ. එනම් ආංගික අභිනය සඳහා භාවිත අංග,

ප්‍රත්‍යාංග හා උපාංග යන සිරුරේ කොටස් තුන ම භාව ප්‍රකාශනය සඳහා යොදාගැනේ. විශේෂයෙන් ම හස්ත මුද්‍රා භාවිතයේ දී සංඥා භාෂාවෙහි සඳහන් පරිදි දෘෂ්ටි, ශීර්ෂ සහ මුහුණේ සියලු අවයව මෙන් ම හස්ත මුද්‍රා සංකේතවත් කිරීමේ දී විවිධ අරුත් පෙන්වීම හෙවත් විනයෝග පෙන්වීම වෙනස් ව සිදු කිරීම මෙන් ම සංඥා භාෂාවේ දී හස්ත මුද්‍රා විවිධාකාර ව ස්ථානගත කිරීමේ දී හා චලනය කරවීමෙන් වෙනස් අරුත් හා වෙනස් අක්ෂර නිර්මාණය කිරීමට භාවිත කෙරෙන අවස්ථා ද නැත්තේ නොවේ. නමුදු සිංහල හා දෙමළ සංඥා භාෂාවෙහි සඳහන් හස්ත මුද්‍රාවල අභිනයදර්පණයෙහි සඳහන් නොවන හස්ත මුද්‍රා ද භාවිතයේ පවතියි. ඒ බැව්, එනම් ලක්දිවට පමණක් ආවේණික ව භාවිතයේ පවතින හස්ත මුද්‍රා ද ඇති බව ඉහතින් සඳහන් කළෙමු. දෙමළ සංඥා භාෂා අක්ෂර මාලාව දැතින් ම සිදු කෙරුණ ද, එක් මුද්‍රාවක් හෝ අභිනයදර්පණයෙහි සඳහන් සංයුක්ත හස්ත හා සමානකම් නොදක්වයි. නමුත් එම හස්ත ස්වාධීන ව අවධානය යොමුකර බලන කල පෙනෙනුයේ දකුණතින් භාවිත කෙරෙන හස්ත මුද්‍රා පමණක් අභිනයදර්පණයේ අසංයුත හස්ත මුද්‍රාවලට සමානකම් විදහා දක්වන බව යි. එමෙන් ම නර්තකයා සතු සංනිවේදන ක්‍රියාවලිය හා ශ්‍රවණාබාධිත පුද්ගලයා සතු සංනිවේදන ක්‍රියාවලිය බොහෝදුරට සමාන බැව් පෙනේ. මේ බැව් පහත දැක්වෙන වගුව මගින් සාරාංශ ගතකොට තිබීමෙන් ප්‍රත්‍යක්ෂ වෙයි.

මෙම හෝඩි පොත්වල අක්ෂර විමසාබැලීමේ දී අභිනයදර්පණයේ සඳහන් හස්ත මුද්‍රා වශයෙන් හැඳින්වෙන පතාක, ඌර්ණනාභ, තාම්රචූඩ, චන්ද්‍රකලා, අර්ධ සූචි, මුෂ්ටි, සූචි, මුකුල, කර්තරීමුඛ, හම්සපක්ෂ, කපිත්ථ, හම්සාස්‍ය, චතුර, මෘග ශීර්ෂ, ත්‍රිශූල, බාන යනාදී හස්ත 16ක් ම ඒ අයුරින් ම භාවිත කෙරේ.

එබැවින් නර්තකයා වාචික අභිනයෙන් තොර ව දක්වන හස්ත මුද්‍රා සහිත ඉදිරිපත් කිරීම් සාමාන්‍ය ප්‍රේක්ෂක ජනතාවට වඩා ශ්‍රවණාබාධිත ප්‍රේක්ෂකයාට වටහාගත හැකි බවත්, රසාස්වාදයක් ලැබිය හැකි බවත් මෙනයින් පෙන්වා දිය හැකි ය. එපමණක් ද නොව නන්දිකේෂ්වර ගේ අභිනයදර්පණයේ සඳහන් හස්ත මුද්‍රාවලට අමතර ව ශ්‍රී ලංකාවට අනන්‍ය වූ හස්ත මුද්‍රා කිහිපයක් සිංහල සංඥා හෝඩි භාෂාව සඳහා නිර්මාණය වී ඇති බව ද මෙම අධ්‍යයනයෙන් තහවුරු වේ.

වගුව 02

හස්ත මුද්‍රා විස්තර

	සිංහල සංඥා භාෂා හෝඩියේ සඳහන් හස්ත මුද්‍රා	අභිනයදර්පණයේ සඳහන් හස්ත මුද්‍රා	අභිනයදර්පණයෙහි සඳහන් නොවන හස්ත මුද්‍රා
ස්වර	උ	පතාක	
	අ, අං, අඃ	මුකුල	
	ආ, ඔ	ඌර්ණ නාභ	
	ඇ, ඈ	තාම්රචූඩ	
	ඊ	නාග බන්ධ	
	ඔ	මුෂ්ටි	
	ඒ, ඓ	සූචි	
ව්‍යඤ්ජන	ල්	චන්ද්‍ර කලා	
	ජ්, ච්	තාම්රචූඩ	
	ෂ්		✓
	ච්	ත්‍රිශූල	
	ඒ		✓
	ඥ		✓
	ඝ, ද්, ධ	සූචි	
	ෆ්		✓
	ක්, බ්, ඟ, හ්	කර්තරී මුඛ	
	ග්, ඟ්	අර්ධ සූචි	
	ඡ්, ඣ්, ඤ්	භාන හස්ත	
	ට්, ඨ්	කපිත්ත	
	ත්, ථ්		✓
	න්, ණ්	අර්ධ මුෂ්ටි	
	ඳ්		✓
	බ්, භ්		✓

ආශ්‍රිත ග්‍රන්ථ

කුරුකුලසූරිය, එස්. (2011). *ශ්‍රී ලංකා සංඥා භාෂා වැඩ පොත.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

කෝට්ටගොඩ, ජේ. (2001). *දේශීය නර්තනයේ ඇතුළත් සන්නිවේදන ලක්ෂණ.* බොරලැස්ගමුව: ජේ. කේ. පබ්ලිකේෂන්ස්.

පතිරණ, එස්. (සංස්.). (2003). *අභිනයදර්පණ.* නුගේගොඩ: ජේ. ඇන්ඩ් ජේ. මුද්‍රණාලය

බුද්ධදත්ත හිමි, පී. (1959). *උභතපූරණසහිතො මහාවංසෝ.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මහාවංශය(සිංහල පරිවර්තනය). (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

මාරසිංහ, ඩබ්. (පරි.). (2004). *භරතමුණි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර* (ද්විතීය භාගය). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

මුස්තාෆා, එම්. (සංස්.). (2001). *අරාබි උර්දු ශබ්ද කෝෂය.* ලක්නවු: සච්චිදා නන්ද පාඨක ප්‍රකාශක

වනරත්න, ආර්. (සංස්.). (2001). *ලීනාර්ථ වර්ණනා සහිත උම්මග්ග ජාතකය.* කොළඹ: සමයවර්ධන පොත ප්‍රකාශකයෝ.

සෝරත හිමි, වී. (1963). *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය.* කොළඹ: ප්‍රේමසිරි අභයවික්‍රම ප්‍රකාශන

හෙට්ටිආරච්චි, එන්. (2009). *සංඥා භාෂාව පිළිබඳ වාග් විද්‍යාත්මක විමර්ශනය*, කුරුණෑගල: අනුර ප්‍රින්ටර්ස්

Andra, C. (2009). Guestures and styles of communication. *Lyon France.* http://ife.ens-lyon.fr/publications/editionelectronique/cerme6/wg10-04-andra.pdf

Benerji, P. (1985). *Art of Indian Dancing.* New Delhi: Sterling Publishers.

Naragatti, S. (2019). *Yoga for health and wellness.* ResearchGate. https://www. researchgate.net/publication/334508457_YOGA_FOR_HEALTH_AND_WELLNESS

Music in Ediriweera Sarachchandr's *Siṅhabāhu*

Sanjaya Kumara Jayalath

Abstract

Ediriweera Sarachchandra created Manamē in 1956 using the *nādagam* tradition. In a similar manner to Manamē he produced *Siṅhabāhu* in 1961, a play which also employed elements from the *nādagam* tradition. In *Siṅhabāhu*, one can witness several characteristics of the *nādagam* tradition such as the nādagam context, rāgas, tānam, targa, and rhythmic steps. As a result of this musical value, the innovative music in *Siṅhabāhu* managed to bring about a new trend in theatre music. *Siṅhabāhu*, unlike Manamē, was able to contribute an array of musical creations to theatre music because it was created by surpassing *siṅdu rāga* and *nādagam* music. This innovative use of music was instrumental in enriching and developing Sri Lankan theatre music. Here, the influence of other musical traditions as well as Sarachchandra's efforts to enrich the music in his creation under different music directors became successful. *Siṅhabāhu* illustrates a genre of theatre music that is created through an amalgamation of different musical traditions such as *nādagam* music, *rāgadhāri* music, folk music, and *nrutya* music. Hence, the purpose of this study is to engage in an analytical study of the music that is used in *Siṅhabāhu*. I explore the following research question: is the music in *Siṅhabāhu* created by surpassing *nādagam* music? Qualitative and quantitative data were collected through reading primary and secondary material related to the subject area, conducting interviews with specialists in the field, engaging in discussions with *maddala* players, studying the *maddala* rhythm system, and watching *Siṅhabāhu* and studying its music in-depth. The following are the conclusions that I draw from this research: the music used in *Siṅhabāhu* has been able to present profound tragic experiences, though *nādagam* music was used in *Siṅhabāhu*, the play in its application of *nādagam* music surpassed this specific tradition, a theatre music that is intricately connected to *Siṅhabāhu* and its music has been created, the ability of contemporary artists to use *nādagam* music as an ideal to their musical practices, the maddala tradition has survived because it was an integral part of *Siṅhabāhu*.

Keywords : harmony, *maddalaya*, *nādagam* music, *nādagam* rhythm system, *sindu rāga*, theatre music

Submitted on 15 May 2019
Revised on 21 October 2019
Accepted on 23 October 2019
JCDSKAR, 1(1) 2020 January, 69-82 pp
sanjaya85drama@gmail.com

සංක්ෂිප්තය

1956 වර්ෂයේ දී සරච්චන්ද්‍ර විසින් මනමේ නාට්‍යය නාඩගම් සම්ප්‍රදාය ගුරු කොට ගනිමින් නිර්මාණය කරන ලදී. 1961 වර්ෂයේ සිංහබාහු නාට්‍යය නිෂ්පාදනය කරන්නේ ද මනමේ නාට්‍යය මෙන් ම නාඩගම් සම්ප්‍රදායට අනුගත ව ය. නාඩගම් සන්දර්භය, සින්දු රාග, තානම්, තර්ග, ගමන් තාල පද වැනි නාඩගම් අංග ලක්ෂණ සිංහබාහු නාට්‍යයේ ද දැක ගත හැකි ය. මෙම සංගීත ගුණය හේතුවෙන් ම නාට්‍ය සංගීත ක්ෂේත්‍රයේ නව නැඹුමක් ඇති කිරීමට සිංහබාහු නාට්‍යයේ සංගීතයට හැකි විය. මනමේ නාට්‍යයේ නොවූ විරූ සංගීතමය නිර්මාණ රාශියක් නාට්‍ය සංගීත ක්ෂේත්‍රයට දායාද කිරීමට සිංහබාහු නාට්‍ය මගින් හැකි වූයේ එහි සින්දු රාග නාඩගම් සංගීතය සමතික්‍රමණය කරමින් නිර්මාණය කර ඇති බැවින් ය. මෙයින් ශ්‍රී ලාංකේය නාට්‍ය සංගීතය පෝෂණය කිරීමට මෙන් ම ඉදිරි විකාශනයට ද මනා පිටිවහලක් විය. සරච්චන්ද්‍ර විවිධ වූ සම්ප්‍රදායන් ගේ ආභාසය ලබමින් විවිධ සංගීත අධ්‍යක්ෂවරු යටතේ තම නාට්‍යවල සංගීතය පෝෂණය කරගැනීමට ගත් ප්‍රයත්නය ප්‍රතිඵලදායක විය. නාඩගම් සංගීතය, රාගධාරී සංගීතය, ගැමි සංගීතය, නූර්ති සංගීතය, ආදි එකිනෙකට වෙනස් වූ සංගීත සම්ප්‍රදාය ඇසුරු කර-ගනිමින් නිමැවුණු රංග පරම සංගීතයක් සිංහබාහු නාට්‍යයේ විද්‍යමාන වේ. සිංහබාහු නාට්‍යයේ සංගීතය, නාඩගම් සංගීතය සමතික්‍රමණය කොට නිර්මාණය වී තිබේ ද යන පර්යේෂණ ගැටලුව මෙහි ලා විස්තාරණය කෙරේ. ඒ අනුව සිංහබාහු නාට්‍යයේ උපයුක්ත සංගීතය සහ එහි භාවිතය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක නියැලීම මෙහි මූලික අරමුණ යි. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේ දී විෂයානුබද්ධ ග්‍රන්ථ පරිශීලනය, විෂයානුබද්ධ ප්‍රවීණයන් හමු වී කරුණු සාකච්ඡා කිරීම, මද්දල තාල පද්ධතිය අධ්‍යයනය කිරීම, සිංහබාහු නාට්‍ය නැරඹීම සහ එහි සංගීතය අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය යි. මෙම පර්යේෂණ ලිපියෙන් පෙන්වාදෙන නිගමන හා යෝජනා ලෙස ගැඹුරු බෙදාන්ත අත්දැකීමක් කලාත්මක ව ඉදිරිපත් කිරීමට සිංහබාහු සංගීතයට හැකි වීම, නාඩගම් සංගීතයේ ඇති සින්දු රාග යොදාගත්ත ද සිංහබාහු නාට්‍ය සඳහා ඒවා යොදාගැනීමේ දී නාඩගම් සංගීතය සමතික්‍රමණය කර ඇති බව, සිංහබාහු නාට්‍යයේ සංගීතයට නාට්‍යයට අවියෝජනීය ලෙස බද්ධ වූ නාටකීය හා රංගපරම සංගීතයකින් නිර්මාණය වී ඇති බව, අද්‍යතන නිර්මාණකරුවන්ට නාඩගම් සංගීත නිර්මාණය පිළිබඳ පූර්වාදර්ශයක් ලෙස ගුරු කොට ගැනීමට ඇති හැකියාව, මද්දල තාල පද්ධතිය සහ මද්දල වාදනය සිංහබාහු නාට්‍යයට ඇතුළත් වීම හේතුවෙන් එම සම්ප්‍රදාය නොනැසී පැවතීම ආදිය තහවුරු කරවාලයි.

ප්‍රමුඛ පද: නාඩගම් තාල පද්ධතිය, මද්දලය, රංග පරම, සින්දු රාග, ප්‍රසංවාද

හැඳින්වීම

ශ්‍රී ලාංකේය විදග්ධ නාට්‍ය සම්ප්‍රදායක් ආරම්භ වන්නේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ගේ පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස 1956 වර්ෂයේ නිෂ්පාදිත මනමේ නාටකයෙනි. අනතුරු ව නිර්මිත සිංහබාහු මේ සම්ප්‍රදායේ නිෂ්පාදිත විශ්මිත වෑයමකි. (විජේසූරිය, 1997, පි. 134)

ගැඹුරු බෙදාත්මක අද්දැකීමක් කලාත්මක ව ඉදිරිපත් කිරීමට සරච්චන්ද්‍රයන් සිංහබාහු නාට්‍යය සඳහා සුසංයෝගී, රංග පරම වූ, නාටකීය සංගීතයක් යොදාගනී. සිංහබාහු නාට්‍යයේ සංගීතය, නාඩගම් සංගීතය සමතික්‍රමණය කොට නිර්මාණය වී තිබේ ද යන පර්යේෂණ ගැටලුව මෙහි ලා විස්තෘත කෙරේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සරච්චන්ද්‍ර ගේ සිංහබාහු නාට්‍ය නිර්මාණයෙහි උපයුක්ත සංගීතය සහ එහි භාවිතය පිළිබඳ ව කරුණු ගෙනහැර දැක්වීමයි.

සරච්චන්ද්‍ර ගේ සිංහබාහු නාට්‍යයෙහි උපයුක්ත සංගීතය සහ එහි භාවිතය පිළිබඳ ව කරුණු ගෙන හැර දැක්වීමේ දී 1952 වර්ෂයේ දී වේදිකාගත වූ පබාවතී නාට්‍යයට පෙර හා පසු ව සරච්චන්ද්‍ර විසින් නිර්මාණය කරන ලද සියලු ම නාට්‍ය කොටස් තුනකට දැක්විය හැකි ය.

1. ගීත නාට්‍ය
2. ගීතාංග නාට්‍ය
3. තාත්වික නාට්‍ය (විජේසූරිය, 1997, පි. 50)

සරච්චන්ද්‍ර ගේ නාට්‍ය නිර්මාණවල සංගීතය උපයුක්ත වී ඇත්තේ මෙම ගීත නාට්‍ය සහ ගීතාංග නාට්‍යයවල ය. ඔහු විසින් නිෂ්පාදනය කරන ලද ගීත නාට්‍ය සහ ගීතාංග නාට්‍ය කිහිපයකි.

I. ගීත නාට්‍ය	II. ගීතාංග නාට්‍ය
■ මනමේ	■ පබාවතී
■ පේමතො ජායතී සොකො	■ රත්තරන්
■ එලොව ගිහින් මෙලොව ආවා	■ කදාවළලු
■ සිංහබාහු	■ හස්තිකාන්ත මන්තරේ
■ ගොම්මන් කෙකණිය	■ වෙල්ල වැහුම්
■ ඈ නුවන් ලැබුවා	■ ඒකට මට හිනා හිනා
■ ලෝමහංස	■ මහාසාර
	■ වෙස්සන්තර
	■ බවකඩතුරාව

(විජේසූරිය, 1997, පි. 1)

මෙම දෘශ්‍ය කාව්‍ය සඳහා සංගීතය නිර්මාණය කරගැනීමේ දී සරච්චන්ද්‍ර විවිධ වූ සම්ප්‍රදායන් ගේ ආභාසය ලැබීමත්, විවිධ සංගීත අධ්‍යක්ෂවරු යටතේ එම නිර්මාණාවලිය පෝෂණය කරගැනීමත් දැක ගත හැකි අතර නාඩගම් සංගීතය, රාගධාරී සංගීතය, ජන සංගීතය ආදි

වශයෙන් එකිනෙකට වෙනස් වූ සංගීත සම්ප්‍රදායන් ගේ ආභාසය ලබාගනිමින් නාට්‍යයේ සංගීතය නිමවා ඇති බැව් එකී නිර්මාණ විමර්ශනයෙන් තහවුරු වේ.

සිංහබාහු නාට්‍යයේ දැකගත හැකි කැපී පෙනෙන ලක්ෂණයක් නම්, භාව ගීතමය (Lyrical) ගුණය යි. භාව ගීතමය ගුණය යනුවෙන් අදහස් කරනුයේ, කාව්‍ය සහ සංගීත යන කලාවන්හි සුසංයෝගයෙන් උපදනා කාව්‍ය සංගීතමය ගති ස්වභාවය යි. භාව ගීතමය ගුණය කරණකොටගෙන සංගීත ක්ෂේත්‍රයේ නව නැම්මක් ඇති කිරීමට සිංහබාහු සංගීතයට හැකි විය. (අරවින්ද, 2011, පි. 78)

1961 වර්ෂයේ සිංබාහු නිෂ්පාදනය වන්නේ මනමේ නාට්‍යය මෙන් ම නාඩගම් සම්ප්‍රදායට අනුගත ව ය. නාට්‍යය සන්දර්භය, සින්දු රාග, තානම්, ගමන් තාල පද වැනි නාඩගම් අංග ලක්ෂණ සිංහබාහු නාට්‍යයේ ද දැකගත හැකි ය. විශේෂයෙන් මනමේ නාට්‍යයේ නොවූ විරූ නිර්මාණ රාශියක් සංගීත ක්ෂේත්‍රයට දායාද කිරීමට සිංහබාහු නාට්‍යයෙන් හැකි වූයේ මෙහි සින්දුරාග නාඩගම් සංගීතය සමතික්‍රමණය කොට ඇති බැවිනි. එය ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍යය සංගීතය පෝෂණය කිරීමට මෙන් ම ඉදිරි විකාශනයට ද මනා පිටිවහලක් විය.

සිංහබාහු නාට්‍යය පුරා දිවෙන සංගීතය විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන තවත් කරුණක් නම්, දේශජ උරුවක් සහිත සංගීත නාද රටා ඇසුරු කරගැනීම යි. එය මෙහි සුවිශේෂත්වයට බලපෑම් කරන තවත් සාධකයකි.

සරච්චන්ද්‍ර විසින් සිංහබාහු නාට්‍යය නිෂ්පාදනය කරනු ලබන අතරතුර දී මුහුණ දුන් බරපතළ ම ප්‍රශ්නය වී ඇත්තේ තම සිතැඟි කියාපෑමට, ස්වීය ගැඹුරු බෙදාත්මක අත්දැකීම කලාත්මක ගැඹුරකින් සහ පොහොසත් දෘෂ්ටියකින් යුතු ව ප්‍රතිනිර්මාණය කිරීමට තරම් සමත්කම් දක්වන නාඩගම් තනු සොයාගැනීම උගහට වීම යි. මේ වන විට ගුණසිංහ ගුරුනාන්සේ අභාවයට පත්ව ඇති නිසා ඔහු ගේ පුත්‍ර වූ නෝමන් ගුණසිංහ සතු වූ තනු සිංහබාහු නාට්‍යයට නොසැහුණු බව කියැවේ. (සරච්චන්ද්‍ර, 1997, පි. 187,188)

ඊට විකල්ප වශයෙන් සින්දු රාගවලින් තුනෙන් පංගුවක් පමණ සංගීතවේදී එච්.එච්. බණ්ඩාර විසින් නිර්මාණය කරන ලදි. (සරච්චන්ද්‍ර, 2012) එහි දී වූව ද දේශජ උරුවෙන් පිටතට නොයා නාඩගම් සින්දු රාග, නුර්ති ගීත, ජන ගීත ආදි වශයෙන් නිමවා සුසංයෝජනය කරන ලද බව සිංහබාහු නාට්‍යයේ ගීත ඇසුරෙන් පෙන්වාදිය හැකි ය.

මෙහි දී යොදාගත් නාඩගම් ගීත සහ සිංහබාහු නාට්‍යයේ ඒ ඇසුරින් නිර්මිත ගීත පහත සඳහන් ලෙස වෙන් කොට හඳුනාගත හැකි ය.

නාඩගම	නාඩගම් ගීතය	සිංහබාහු ගීතය
ඉයුජින්	යහනත අතුළ මල්	බුදුතුල් ගුණැති සමිඳුනේ
වෙස්සන්තර	පින්සරු ධීරා	දස දෙස ඉන්ද්‍රා
වෙස්සන්තර	කිමද අනේ	ඇසට නැතේ
චූලනී	ආසා වඩන කොමලංගනියේ	මෙන් කමලේ

මේ අයුරින් නාඩගම් සින්දු රාග තුළින් උත්තේජනයක් ලබමින් එකී සින්දු රාග කෙබඳු ලෙසකින් සිංහබාහු ගීත නිර්මාණය කිරීම සඳහා භාවිත කොට ගත්තේ ද යන කාරණය විමසා බැලීම වැදගත් ය.

''මෙන් කමලේ දෙන රැව් මිහිලොල්'' යන ගීතය ගේහසිත ප්‍රේමය උතුරා යන රචනාවකි. ඒ සඳහා යොදාගෙන ඇත්තේ චූලනී නාඩගමේ ''ආසා වඩන කොමලංගනියේ'' යන සින්දු රාගයේ තනුව ය.

ආසා වඩන කොමලංගනියේ
දැස දැක ම සිත ප්‍රීති වියේ
රාගේ ලෙසට දෙදෙනගෙ සුපසන්
දෝසෙ කෙළෙද නිරිඳුට පවසන්

මෙකී ගීතය චූලනී නාඩගමේ ගායනා වන්නේ 6/8 නැතිනම් නාඩගම් තාල පද්ධතියේ තංගපාට තාලයට අනුව ය.

තංගපාට තාලය - සින්දු තාලය - 6/8

1	2	3	1	2	3	1	2	3	1	2	3
තක්	-	ජෙ	ඟ	ජෙ	ඟ	ජෙ	ග	ටි	ජෙ	ඟ	ං

එසේ වුව ද සරච්චන්ද්‍ර මෙම තනුව ම මෙන් කමලේ ගීතයට යොදාගෙන ඇත්තේ එහි තාලය 4-3 වශයෙන් මාත්‍රා බෙදෙන **වඩිමුඩි** තාලයට ය. වඩිමුඩි තාලය නාඩගම් තාල පද්ධතියේ දී වැයෙන තාලයකි. මෙහි සුවිශේෂී බව වන්නේ 4-3 වශයෙන් මාත්‍රා බෙදීම යි. කර්ණාටක තාල පද්ධතියේ එන චතුරස්‍ර ජාති ඣම්පායි තාලයට සමාන බවක් ඇත. මෙකී ලයමානය වෙනස් වීමෙන් ම නාටකීය අවස්ථාව මතු කිරීම හැකි වීම නිසා එහි රංග පරම බව අපේක්ෂිත අයුරින් ඉටු වී ඇති අයුරු ප්‍රත්‍යක්ෂ වේ.

වඩිමුඩි තාලය - සින්දු තාලය - 7/8

1	2	3	4	1	2	3	1	2	3	4	1	2	3
තක්	-	කුං	-	ත	ක	ට	දික්	-	කුං	-	තා	-	-

''මෙන් කමලේ දෙන රැව් මිහිලොල්'' ගීතයේ ස්වර ප්‍රස්තාරයේත්, ඒ සඳහා පාදකකොට ගත් ''ආසා වඩන කොමලංගනියේ'' නාඩගම් ගීතයේ ස්වර ප්‍රස්තාරයත් කොටසක් පමණක් යම් අවබෝධයක් ලබාගනු වස් පහත දක්වා ඇත.

<u>මෙන් කමලේ දෙන</u> - **වඩිමුඩි තාලය** C^m 7/8


ස - -	ස - ස -	ස - -	ස - ස -	ස - -	ස - රි -	ස නි -	- - - -
මෙන්ස	කස මස	ලේ ස ස	දෙ ස නස	රැව් ස	මි ස හි ස	ලොල්ස	සසසස
ස - -	ග - ම -	ප ධ -	ප - ම -	ග රි -	ග - රි -	ස - -	- - - -
මු දා ස	තෙ ස පස	ලි න් ස	ර ස ද ස	නා ස ස	හැ ස ම ස	ක ල් ස	සසසස
ස - -	ප - ප -	ප - -	ප - ම -	ම ප -	ප - ම -	ප -නි	ධනිධප
පෙම්ස	බ ස රි ස	යේ ස ස	නු ස ඹ ස	දු න් ස	මෙ ස ව ස	ද න් ස	සසසස
+ + +	ම් -ම් ම්	ම් - -	ම් - රි -	රි ම් -	ප - ධ -	ප - -	- - - -
+ + +	දොම්නස	ප හ ස	ක ස ර ස	ව යි ස	සි ත් ස ස	ත න් ස	සසසස

ආසා වඩන කොමලංගනියේ - **තංගපාට තාලය** C^m 6/8

ප - ප - ස -	ස - ස - ස -	ස - ස - රි -	නි - - - - -
ආ ස සා ස ව ස	ඩ න ස කොම ස	ලංස ග ස නි ස	යේ ස ස ස ස ස
ස - ග - ම -	ප ධ - ප ම -	ග රි - ග රි -	ස - - - - -
දෑ ස සා ස දෑ ස	ක ම ස සි ත ස	ප්‍රී ස ති ස වි ස	යේ ස ස ස ස ස
ස - ස ප ප -	ප - - ප ම -	ම ප - ප ම -	ප - නි ධ - -
රා ස ගේ ස ලෙ ස	ස ට ස දෙ දෙ ස	න ගේ ස සු ප ස	සන් ස- ස ස ස
ම් - ම් - ම් ම්	ම් ම් - ම් ම් -	රි ම - ප ධ -	ප - - - - -
දෝ ස සේ ස කෙ ස	ලෙ ස ස නි රි ස	ඳු ට ස ප ව ස	සන් ස ස ස ස

නාඩගම් සංගීතයේ පැවති හරය සහ රසය උකහාගනිමින් එය වඩාත් නාටකීය, රංග පරම මෙන් ම වස්තු බීජය පෝෂණය කරන්නක ලෙස යොදාගැනීම සිංහබාහු නාට්‍යයේ භාවිත සංගීතයේ තවත් සුවිශේෂීතාවකි. මෙම අදහස සනාථ වන්නේ සිංහබාහු නාට්‍යයේ අතිශය ජනප්‍රිය මෙන් ම භාවාතිශය ගීතය වන ගල්ලෙන බිඳලා ගීතය විමසා බැලීමෙනි.

ගල්ලෙන බිඳලා වඩිමුඩි තාලය F 7/8



(කොටසක් පමණි)

මෙම ගීතය සිංහබාහු නාට්‍යයේ එන භාවාත්මක ම ගීතය යි. සිය අඹුදරුවන් හැර දා ගොස් ඇති බව සිංහයා දැන ගන්නා එම උද්වේගකර අවස්ථාව අතිශයින් ම තීව්‍ර කිරීමට ඉවහල් වන්නා වූ මෙම සංගීත රචනාව සමස්ත නාඩගම් ගීත සාහිත්‍යයේ ම විශිෂ්ටතම නිර්මාණය බවට කිසිදු විවාදයක් නැත.

ගල්ලෙන බිඳලා යන ගීතයේ සංගීත රචනාව සංගීතවේදී එච්.එච්. බණ්ඩාර ගේ විශිෂ්ටතම සංගීත රචනාවකි. නියමිත රටාවකට, නැතිනම් රිද්මයකට නොලියවුණු මෙම රචනාවට තනුවක් නිර්මාණය කිරීමේ අභියෝගය අතිශය සාර්ථක ව ජයගෙන ඇති අයුරු ගීතය විමසීමෙන් තහවුරු වේ. අගාරම් ලක්ෂණ, උරුට්ටු ලක්ෂණ, තාල රහිත ගායනා ආදි වූ නාඩගම් සංගීතයෙහි දැකගත හැකි බොහෝ අංග ලක්ෂණ මෙම ගීතය තුළ දැක ගත හැකි ය. විශේෂයෙන් බුවනෙකබාහු සහ සිංහවල්ලී යන නාඩගම්වල ඇතුළත් සින්දු රාග බොහෝවක ආශ්‍රේය නාද රටා සිංහබාහු නාට්‍යයේ සංගීතය නිර්මාණය කිරීම සඳහා එච්.එච්. බණ්ඩාර තෝරාගෙන ඇති අතර ඒවා ද යෝග්‍ය පරිදි නවීකරණය කරමින් වෙනස් කරමින් ස්වතන්ත්‍ර තනු නිර්මාණය කර ඇති බව නාට්‍යයේ ගීත විමසීමෙන් පෙනී යයි.

සිංහබාහු නාට්‍යයේ සංගීත භාවිතය පිළිබඳ ව විමසීමේ දී නාඩගම් තාල පද්ධතිය හා මද්දල වාදනය නාට්‍යයට එන්ද්‍රීය ලෙස බද්ධ වී ඇති අතර චරිත, චරිතවල මනෝභාව, අවස්ථා හා සිද්ධි තීව්‍ර කිරීම සඳහා මද්දලය ප්‍රධාන කොට ගනිමින් මෙහි සංගීතය භාවිත කොට ඇති බව විද්‍යමාන වේ.

පුරුදු පරිදි වනයෙන් සොයා ගෙන නෙක් ගොදුරු
මිඟිදා එයි සතොසින් නොදැන වූ දේ නපුරු
දැක ගල පසෙක වැටී ලෙන හිස්ව තිබූ අයුරු
දැඩි සොවින් ගොස නගයි වනපෙත කර දැදුරු(සරච්චන්ද්‍ර,2012,පි.32)

මෙම පොතේ ඉන්නිසයෙන් පසු සිංහයා වේදිකාවට පිවිසෙන්නේ කඩිනම් පසන් තාලයට ය. ලෙන හිස් ව ඇති බව දකින සිංහයාගේ නර්තනය වින්‍යාස ගත කර ඇත්තේ වඩිමුඩි තාලයට ය. එමගින් ගල්ලෙන බිඳලා ගීතයට පෙර එකී නාටයෝචිත අවස්ථාව තීව්‍ර කිරීමට හැකියාව ලැබී ඇත.

කඩිනම් පසන් තාලය ළ (වැඩි තාලය)

1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
දි	කු	ං	ත	ත	රි	කි	ට	දි	කු	ං	ත	ත	රි	කි	ට

වඩිමුඩි තාලය

1	2	3	4	1	2	3	1	2	3	4	1	2	3		
ජෙ	ං	කි	ට	ත	ං	කි	ත	ං	කි	ට	ත	ං	කි	(අඩු තාලය)	
දි	කු	මි	ට	දි	කු	ම	දි	කු	මි	ට	තා	-	-	(වැඩි තාලය)	

සිංහබාහු නාට්‍යයේ සංගීතය තුළ හුදෙක් ම නාඩගම් ගී තනුවල ජානමය ලක්ෂණ පමණක් අඩංගු නැත. සරච්චන්ද්‍ර ගේ පර්යේෂණ ක්‍රියාන්විතය තුළ තමා උපයාගත් සකලවිධ ඥාන සම්භාරය ඉතාමත් ප්‍රවේසමෙන් ඖචිත්‍යයෙන් යුතු ව ගළපා ඇති බවක් පෙනේ. සිංහබාහු නාට්‍යයේ සංගීතය ඒ තුළින් උත්කෘෂ්ටත්වයට නැංවෙයි.

සුප්පාදේවිය ගයන ''වගුරට නරනිඳු'' ගීතයේ තනුව දකුණු පළාතේ ප්‍රකට දරුනැළවිලි ගීයක තනුවක් ඇසුරින් නිර්මිත ය.

''රූබර රජපුත නිදියන්නේ
නාඬා කිරි බී සැතපෙන්නේ'' (ජේ. අරවින්ද, සම්මුඛ සාකච්චාව, 2018 අගෝස්තු 31)

රූබර රජ පුත - F 4/4

ස ම ම ග	ම ප ප ධ	ම - ම ග	රි ග ස -
රූ s බ ර	ර ජ පු ත	නි දි යන්	නේ s s s
ස රි රි ස	රි ප ප ධ	ම ග රි ග	ම - - -
නා s ඩා s	කි රි බී s	සැතපෙන්	නේ s s s

ඇලඩින් සහ පුදුම පහන නුර්තියේ ''මා සිත් සේ ආලයෙන් මනා''යන තනුව ඇසුරින් ''රාජ කුමරියෝ පළඳිති රන් මිණි බරණා'' යන ගීතය ප්‍රබන්ධ කර ඇති අතර ''නොකරන් මා පුතුනේ මේ සටනා'' යන ගීතය හලාවත ධීවර ගම්මානයක දී සරච්චන්ද්‍රයන් සොයාගත් තනුවක් ඇසුරින් නිර්මාණය කර ඇත.(ජේ. අරවින්ද, සම්මුඛ සාකච්චාව, 2018 අගෝස්තු 31)

මා සිත් සේ ආලයෙන් මනා - C 7/8

			+ + + සුරී
			+ + + මා s
ග ග ග	ග - - රි	ස රි ග	ගුරිසු - - ස
සිත් සේ	ආ s s ල	යෙන් ම	නා ss s s ව
ග ග ග	ප ප ප ම්	ප - -	- - - ප්‍රධ
සන් නෙ	කොයි s දි	නේ ss	s s s රූ s
නි - නි	නි නි නි ධ	ප - ම්	ප - - ගුග
ශ්‍රී s ඨ	දු ල් s කු	මා s ර	යා ss ඇත්
ග - රි	ග - ප ම්	ප - -	- - - -
වේ s වි	දෝ s s අ	නේ s s	s s s s

(කොටසක් පමණි)

රාජ කුමරියෝ පළඳිති - **තිර්ලානා තාලය** C 3/4

ස රි ග	ග ග -	රි - ග	රි ස නි
රා s ජ	කු ම රි	යෝ s ප	ළ දි ති
ස ග රි	ග ප ම	ප - -	ගුපරිගුසරි
ර න් මි	ණි බ ර	ණා s s	ss ss ss
ස රි ග	ග ග -	රි - ග	රි ස නි
සි නි දු	ව ස් ත්‍ර	හැ ඳ ලා	s ර න්
ස ග රි	ග ප ම්	ප - -	සුරිගුමපධ
මි රි වැ	ඩි ස ඟ	ලා s s	ss ss ss

සිංහබාහු නාට්‍යයේ සංගීතය නවීකරණය කිරීමේ කාර්යභාරය පැවරී තිබුණේ ජයන්ත අරවින්දට ය. ජයන්ත අරවින්ද ඒ පිළිබඳ ව සිය මතකය මෙසේ අවදි කරයි.

"සිංහබාහු ඇතුළු සරච්චන්ද්‍ර නාට්‍යවල සංගීතයේ ව්‍යාප්ත නවීකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට සරච්චන්ද්‍ර කල්පනා කළේ ය. පසු කාලයේ සිංහබාහු නාට්‍යයේ නාඩගම් ගී තනුත්, බණ්ඩාර ගේ ස්වතන්ත්‍ර ගී තනුත්, අනියම් මූලාශ්‍රයවලින් එකතු වූ තනුත් අතර කිසියම් පරස්පර නොගැළපීමක් දකින එතුමා එම ගීත ස්ට්‍රීම් ලයින් (Stream line) සමතුලිත කිරීමේ කාර්ය පැවරුයේ මා වෙත ය. මේ කාර්ය ඉටු කරමින් සිංහබාහු ගීත රාශියක ගී තනු වෙනස් කර මවිසින් නව තනු ආදේශ කරන ලදී." (ජේ. අරවින්ද, සම්මුඛ සාකච්චාව, 2018 අගෝස්තු 31)

නිර්මාණ කාර්යයෙහි නිර්මාණාත්මක වටිනාකම රඳාපවතින්නේ මූලාශ්‍රය කෙතරම් දුරට නිර්මාණයට අදාළ කරගත්තා ද යන කරුණ මත නො වේ. එය කෙතරම් දුරට ප්‍රතිනිර්මාණය කර නවතාවකට, පෙර නොවූ විරූ, නොඇසූ විරූ දෙයක් බවට පත්කළා ද යන කරුණ මත ය. සිංහබාහු නාට්‍යයේ සංගීතය ඒ අංශයෙන් ද සුවිශේෂී ප්‍රතිභාවක් ප්‍රතීයමාන කරයි.

මුල් නිෂ්පාදනයේ දී **පොතේ ඉන්නිසය, පූර්ණ විරිඳුව** ගායනා කර ඇත්තේ මනමේ නාට්‍යයේ පරිදි ය. මනමේ නාට්‍යයේ එකී ගායනා කෙරෙන්නේ නාඩගම් සම්ප්‍රදායට අනුගත ව වුවත් විශාරද ජයන්ත අරවින්ද ගේ මෙකී නවීකරණයත් සමඟ මෙම පොතේ ඉන්නිසවල ගායනා විලාස සහ පූර්ණ විරිඳුවේ ගායනා විලාස වෙනස් විය. මෙහි දී නාඩගම් ගායන රටාවෙන් බැහැර ව ඒ ඒ වෘත්ත සඳහා වෙනස් වූ තනු නිර්මාණය කර ඇති බැව් එකී තනු විමර්ශනයෙන් පසක් වේ.

සසර බියවැද ගොර බිරම් මුල් තනුව මනමේ නාට්‍යයේ පූර්ණ විරිඳුව පරිදි :

සසර බිය වැද (මුල් ගායනය)

ප - ප ප-ප- ප - ප ප ප - - - ප ධ නි - - - ධ ප ධ - - ප - - - -
සසර බියවැද ගොරබිමේ‍s s s s s s s s s s s s s s s s s s s s

ම - ම ම ම ම ම - - - - ග ග ම - - - - - ධපධනි - - - ධ - ප - ම - ග - -
සවි ස ත නිතියෙන් s s පෙළනා s s s s s ss ss s s s s s s s s s s s

ග - ග ග - ග - ම - ම ම ම - ම - - - - ග රි ග - - රි - - ස - - - -
ප ව ර අ මා s ඹ සු ස ද හ ම්‍s s s s s s s s ss ss s s s s s s

ස ස - මමම ප - - - - ග - ගග - ග - - - රිස නි - නිස රිග - රි - -ස - -
දොවසනසනා s s s sඅටියෙනා s s s s s ss s s ss ss s s s s s s s

ජයන්ත අරවින්ද විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර තනු රචනාව :
සසර බිය වැද (පූර්ණ විරිඳුව)

ස ස රි ග ග ග ම ප - ප ප ssssස - ස රි ග ග ම ප - ප ප - - - -
ස ස ර බි ය ව ැ ද ගොරබිමේssssස ව් ස තනිතියෙන් පෙළෙමිනාss

- - - ප ධ නි - - - ධ - - ප - - - - - - ස ස රි ග ග - ම ම ම ම ම - -
s s s s s s s s s s s s s s s s s s s s s ප ව ර අ ම ා s ඔසු සදහම් ss

ස ස රි ග ම ප ප - - - ම ම ම ග - - - - රි ග රි ග ම ප - - - - ම - - ග - - -
දොවාsසනසනාsssඅටියෙනාs s s s s s s s s s s s s s s s s s s s s s s s

වේදිකා නාට්‍යයක ගීත ගායනාවල දී නළු නිළියෝ ශ්‍රැති ස්වරය මත පිහිටා කටහඬ පරාසයෙන් ගීත ගායනා කළ යුත්තා හ. නමුත් යම් යම් අවස්ථාවන්හි දී ශ්‍රැති ස්වරයෙන් බැහැර ව ගීත ගායන ආරම්භ වන අවස්ථා සිංහබාහු නාට්‍යයේ දැකගත හැකි වූ බැවින් ඊට පිළියමක් වශයෙන් ගීතයට පෙර කෙටි ආමුඛ සංගීත ඛණ්ඩ (Introduction) එක් කිරීම විශාරද ජයන්ත අරවින්ද අතින් සිදු විය. එම ආමුඛ සංගීත ඛණ්ඩ මඟින් නළු නිළියන්ට ස්වර මත පිහිටා ගායනය කිරීමට ද, භාවාතිශය හැඟීම් මත පිහිටා රංගනය කිරීමට ද මනා පිටිවහලක් විය.

සිංහබාහු නාට්‍යයේ එන ගීත කිහිපයක ආමුඛ සංගීත ඛණ්ඩ පහත දැක්වෙයි.

වඟුරට නරනිඳු - වඩිමුඩි තාලය F 7/8

|ස++ ප - ධ + | ප ධ ස් නි - ධ + | ප - - ම ග රි ග | ම - - - - - |

තැනු තැන්වල ම - පසන් තාලය C^m 4/4

| නි ස ග ම | පධ නිරි පම ග- | පධ නිස් නිධ ප- | ගම පම ගරි ස- |

සිංහබාහු නාට්‍යයේ ගද්‍ය සංවාද රටා මුලින් ගයා ඇත්තේ කතෝලික ඔරසන් ගායනා වැනි ගායනා රටාවකට සමාන ව ය. මෙය මනමේ නාට්‍යයෙහි ද දැක ගත හැකි ය. ඒ ඒ අවස්ථාවට, චරිතයට සහ ගීතාර්ථයට උචිත පරිදි පුළුල් වූ ස්වර පරාසයක පිහිටා ගායන රටා නිර්මාණය කිරීමක් ගීත නිර්මාණ නවීකරණයේ දී දැක ගත හැකි ය. ජයන්ත අරවින්ද විසින් ස්වර රචනය කරන ලද ''මෙන් කමලේ'' ගීතයට පෙර සුප්පා දේවිය ගයන ගද්‍ය සංවාද රටාව විමසීමෙන් මෙය වඩාත් තහවුරුකොට ගත හැකි ය.

හිමි සඳුනි

ධ ධ - - ප ම ම - - - ග - ග ග ග ග - - ස ම ම ම ම ම - - - - -
හි මි ss ස ඳු නි ssss සිත ට කි සි ඳු බි යක් නොග නු මැ නෙ වි ss s s s

ධ ධ - - - ප ධ ප ම ම ම ම ම-ම ම ම ම ග ග ග ග-ග ග ග ග ග ග ග --
ඔ බ්බෙ ssss මේ ss ද රු දෙ දෙ දෙ නා ද ම ම ද ඔ බ තු මා කෙ රෙ හි නොඅ ඩු වූ ss s

ග - ග ග ග ග - - ස ම ම - ම ම - ම - ම ම ම - - - ම ධ - - ප ධ ප ම ම -
භ ක්ති යෙන් හා ss s ස් නේ ss හ යෙන් ss වෙ සෙ මු ss s යොවුන් ss වි යට පැ මිණ

ම - ම - ම - - ග - ග ග ග ස - ස ම - ම - ම - - - ධ ධ - - ප ධ ප ම ම ම ම -
සි ටින් නා ss වූ ss ඔ බ මෙන් ම ල ද ා ss ර ගු ණ යෙන් හා ss කා ss ය ss බ ල යෙ න් ද

ම - ම - ම ම ම - - - ග ග ග - ග - ස ම ම - ම - - - ග - ග ග - ග ග - -
ස ම්ප න් න වූ ss ss ඔ බ ගේ ss මේ ss ss දෙ ටු පු ත්‍ර යා ss ss ඇ තැ ම්වි ට මෙ සේ ss


ස ම - ම ම ම ම - - - - ස - ස ස - ස ම - ම ම - ම - ම - - - - ධ ධ - ප ම -
දෙ ඩ ස න න මු ත් ss ss ඔ හු ඔ බ ට ආ ss ද ර ය ඇ ත් තේ ය ss ss බි ය ss සං කා ss

ග - ග ග ග ග ග ග - ග ස ම - ම ම ම ම ම ම - - - -
ප හ ක ර ග ත ම නා ss ය දේ ss ව යි නි ss s s s s s s s

සිංහබාහු නාට්‍යයේ දැක ගත හැකි තවත් සංගීත භාවිතයක් වන්නේ ප්‍රතිධ්වනි සංගීත රටාව යි. මෙය ඉන්දුනීසියානු **ගමිලාන්** සංගීතයේ කැපී පෙනෙන අංග ලක්ෂණයකි. මීට පෙර සරච්චන්ද්‍ර සිය **පේමතෝ ජායතී සෝකෝ** නාට්‍යයට මෙකී සංගීත රටාව භාවිතකොට ඇත. මෙය බටහිර සංගීතයේ (Harmony)හෙවත් ප්‍රසංවාදී සංගීත ලක්ෂණය නො වන බව කිව යුතු ය. සිංහබාහු නාට්‍යය සඳහා ජයන්ත අරවින්ද විසින් මෙම ප්‍රතිධ්වනි සංගීත රටාව භාවිත කොටගනිමින් නිර්මාණ සිදුකොට ඇත. ''මෙන් කමලේ දෙන රැව් මිහිලොල්'' යන ගීතයේ භාව ගීතමය ලක්ෂණ වර්ධනය කරමින් ප්‍රතිධ්වනි තනුව වේදිකාව මත ගැයෙන විට ප්‍රේක්ෂකයා තුළ පරිකල්පනීය ආස්වාදයක් උපදවාලීමට සමත් වේ.

''මෙන් කමලේ දෙන රැව් මිහිලොල්'' ගීතයේ ප්‍රතිධ්වනි තනුව පහත දැක්වෙයි.

මෙන් කමලේ දෙන - **වඩිමුඩි තාලය** C^m 7/8



සිංහබාහු නාට්‍යයට පාදක කොටගන්නා ලද සම්ප්‍රදායික ගී තනු සහ අවශේෂ මූලාශ්‍රය ඉහත සඳහන් කළ අතර එච්.එච්. බණ්ඩාර සහ ජයන්ත අරවින්ද විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර තනු රචනා පහත දැක්වෙයි.

එච්. එච්. බණ්ඩාර විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර තනු රචනා

ගල්ලෙන බිඳලා

කිම්ද මෑණියනි
කිම්ද පුතණුව
සිත නොම සැනසේ
වාත වේගෙන්
නොකරන් මා පුතුනේ
වටලා සක්වල
තවත් නරයෙක්ද මේ
ගම රට වනසන
ආදර වදනින්
කිමද සැරය

ජයන්ත අරවින්ද විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර තනු රචනා

සසර බිය වැද ගොර බිමේ
රදවා දූ පුතුන් හා
වියෝවින් වියරු වැටුණු
ලෙසේම වෙමිමම/දයාබර ව සිත සතතින් මුදු වුව
දයාබර හිමියනි උතුම්
සඟවන්ට තතු බැරිය පුතු ගෙන්
වනයෙන් පැමිනුණු
මන්ද අහිංසක
දන නට හද දෙන්නා මෙසේ
කෙලෙසුනිය මිගිදා ගේ (ජයන්ත අරවින්ද, සම්මුඛ සාකච්චාව 2018.08.31)

නාඩගම් ගී තනු සහ එච්.එච්. බණ්ඩාර සහ ජයන්ත අරවින්ද විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර තනු මෙන් ම නවීකරණය කරන ලද යම් යම් තනු මඟින් ද සිංහබාහු නාට්‍යයේ සංගීතය පෝෂණය වී ඇති බැව් මෙයින් පෙනී යයි.

භාව ගීතමය ගුණය, දේශජ උපරුවක් සහිත නාද රටා ඇසුරු කිරීම, ප්‍රතිනිර්මිත ගී තනු භාවිතය, හුදෙක් ම නාඩගම් සංගීතයට ම සීමා නොවී වෙනත් සංගීත මූලාශ්‍රයවලින් ලද ආභාසය, ආමුඛ සංගීත ඛණ්ඩ භාවිතය, සාම්ප්‍රදායික ගී තනු ඇසුරෙන් නිමවාගත් ස්වතන්ත්‍ර තනු රචනාවන් ගේ සුපරීපූර්ණ වීම යන සාධක හේතුවෙන් සිංහබාහු නාට්‍යයේ සංගීතය සුවිශේෂී තැනක් හිමි කරගන්නා බව පැහැදිලි ය.

ආශ්‍රිත ග්‍රන්ථ

අරවින්ද, ජේ. (2011) *සිංහබාහු නාට්‍යයේ සංගීතය: සිංහබාහු සම්ප්‍රශංසා.* ඒ. රණවීර, ටී. කාරියවසම් (සංස්.). කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසූරිය, එස්. (1997) *සරච්චන්ද්‍ර නාට්‍යය දෘෂ්ටිය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සරච්චන්ද්‍ර, ඊ. (1997) *පිං ඇති සරසවි වරමක් දෙන්නේ* (දෙ වන මුද්‍රණය). කොළඹ: සීමාසහිත සරසවි පොත්හල.

සරච්චන්ද්‍ර, ඊ. (2012) *සිංහබාහු නාටකය.* කොළඹ: කාර්තෘ ප්‍රකාශන,

The Historical Background of Manipūri Dance

Dhanushka Washeera Salgamuwa

Abstract

